

# පූරාණ
# පරිවාරගණ ඩීපදයං

පුරාණ

# පරිවාර ගණ්ඨිපදය.

THE PURANA

# PARIWARA GANTHIPADA

EDITED BY

**Revd. B. Dhammaratana Thera**

PRINTED AND PUBLISHED

BY

J. D. P. Perera

AT

VIDYASAGARA PRINTING WORKS

COLOMBO.

1914.

## පුරාණ

# පරිවාරගණ්ඨිපදය.

**නමොතස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

පරිවාරස්ස වක්ඛාමි චූළවග්ගස්සනන්තරං
පාඨවණ්ණාය භික්ඛූනං ලීනමත්ථං සමාසතො

**පරිවාරනම් කුමට වීයයත්?**

විභඞ්ග දෙකෙහි හා ඛන්ධකයෙහි **කීතාක්** සිඛපද **නොයෙක්** ලෙස ධරණහෙයින් දඹදිව පිරිවැරූ මහමුහුදවැනි හෙයින්ද පරිවාරනම් විය. **පස්විසි** බණවරක් ඇත්තේය, **තුන්** සංගායනාවෙහි ඇතුළත්විය, හුයකින් ගෙතුමක් මෙන් උභයවිභඞ්ග උභයක්ඛන්ධක යන් අවුණාසිටියේය, සියලු විනයපහළකරණ ප්‍රයොජන ඇත්තේය.

උභය විභඞ්ගයෙහි හා ඛන්ධකයෙහි "තෙන සමයෙන" යුහ මෙහි "යං තෙන භගවතා" යුහු. මේ දෙක්හි වෙසෙස කිම? එහි කල්සහිත කොට කීහ, මෙහි සිඛපද පමණක් කීහු, තෙන සමයෙන යන්නෙන් සිඛපද පැනවීමට කල බුදුන්ට විෂයබව කීහු, 'යං තෙන, යනුවෙන් බුදුන් පැනවූබව කීහු පඨමං පාරාජිකං යනු එහි ගණනෙහි පළමුවූ බැවින්ද පළමුකොට උපන්බැවින්ද පඨමනම් විය. අවන්නහු පැරදීමට පැමිණෙන හෙයින්ද මහණුන් කෙරෙන් ගිලිහෙන හෙයින්ද ශාසනධර්‍මයෙහි නොපිහිටන හෙයින්ද පරිජිනම්වී.

තෙන භගවතා, සැරියුත් මහතෙරහු විසින් ආරාධිතවූ යම් සඞ්ඝයෙක් අභිකොඨාශ දශයක් පිණිස විනයප්‍රඥප්ති පැනවීද; තෙන, ඒ; භගවතා, සියපින් ලකුණුඇති; ජානතා, සිඛපද පැනවීමට කල්දන්නා; පස්සතා, ඒ ඒ සිඛපද පැනවීමෙහි වැඩ කොටස් දසයක් දක්නාවූ; අරහතා, නිකෙලෙස්වූ; සම්මා සම්බුද්ධෙන, සියලු ධර්‍මයන් මනාකොට තමාවිසින්ම දත්තාහු විසින්; "යං පඨමං පාරාජිකං පඤ්ඤත්තං කත්ථ පඤ්ඤත්තං"

## 2 වෙනි පිංවේ මුද්‍රිත පරිවාරයෙහි

තත්‍ථ, ඒ පළමු පැනවීමෙහි හෝ පරිච්ඡෙයෙහි "අත්‍ථි" යනු උභය පඤ්ඤත්ති යනු දක්වා යොදනු. අනුප්පන්න පඤ්ඤත්ති, නූපන් වස්තුවෙහි අෂ්ටගරු ධර්මවශයෙන් පැනවූ ප්‍රඥප්තියක් ඇත; සබ්බත්‍ථ පඤ්ඤත්ති නම්:—හැමතැනට සාධාරණකොට පැනවූ පනති; පදෙස පඤ්ඤත්ති නම්:—එක් පියසකටම නියමකොට අනුදත් පනති; සාධාරණ පඤ්ඤත්ති නම්:—භික්ෂු භික්ෂුණීන්ට සාධාරණ පනති; අසාධාරණ පඤ්ඤත්ති නම්:—එක් පක්ෂයකටම නියත පනති; සාධාරණ ප්‍රඥප්තිආදි සතර අඞ්ගෙහයින් දෙකම වැයි; කත්‍ථ, කවර උද්දේශයෙක්හි; අනොතාගධං, පිහිටියේද; පරියාපන්නං, ඇතුළත්ද; කතමං අධිකරණං, කවර අධිකරණයද; එකෙන සමුට්ඨානෙන; පඨමපාරාජික සමුට්ඨානයෙන්; සමුට්ඨාති; වෙයි; විභත්ති අභිවිනයො, පදභාජනීය අභිවිනය නම්වේ; අධිපාතිමොක්ඛ නමුදු ඒ මැයි; අසංවරො, සංවරය නොකිරීම; සංවරො, සම්පත්ති චාරිත්‍ර ශික්ෂාව ගුරුකරණ බලසම්පත්ති නම්; එවරූපං, මෙබන්දක්; යාව ජීවං, දිවිපමණින්; ආපාණ කොටිකං, දිවිකෙළවර දක්වා; සමාදය, පිහිටුවා නොහොත් මනාකොට ගෙණ; සංඝසුට්ඨුතාය, සංඝයා විසින් 'සාධු සුට්ඨු'යි පිළිගැන්ම පිණිස; සංඝඵාසුතාය, සංඝයාහට ඵාසුබව පිණිස; දුම්මඞ්කූනං පුග්ගලානං, කරබැඳියයුතු පුද්ගලයන්ගේ; නිග්ගහාය, නිග්‍රහය පිණිසද; දුස්සීල පුගුලන් නිගන්නා පිණිස යයි යුසේයි; පෙසලානං භික්ඛූනං, ප්‍රියශීලී සිල්වත් මහණුන්ට; ඵාසුවිහාරාය, සුවවාසය පිණිසද; දිට්ඨධම්මිකානං ආසවානං, වතීත මානවූ කෙලෙසුන්ගේ; සංවරාය, වැළකීම පිණිසද; සම්පරායිකානං, පරලොව. විඳියුතු; ආසවානං, අපායිකාදි දුඃඛයන්; පටිඝාතාය, නැසීම පිණිසද; විනයානුග්ගහාය, විනයට අනුග්‍රහ පිණිසද; යෙසං වත්තන්ති, යම් කෙනෙකුන්ට විනය පිටකයත් අට්ඨකථාවත් වනපොත්ද; පරම්පරාභතං, පෙර පරපුරෙන් ගෙණෙන ලද්ද;

## 3 වෙනි පිංවේ

තතො, උන් කෙරෙන්; සත්තවෙව පකරණෙ, ප්‍රකරණයන් සත්දෙනාද; වාචෙසුං, හැදෑරුවූහ; දුප්පධංසියො, මැඩගත නොහැක්කෝය; තිපෙටකී, තෙවළාධර; ධම්මනාමො, චූළාභය තෙරහු; දීපෙ, හෙළදිව; තාරකරාජාව, චන්‍ද්‍රයා මෙන්; පඤ්ඤාය අභිරොචයි, නුවණින් ඉතා බැබළුණේයි; පුප්ඵනාමො බහුස්සුතො, බහුශ්‍රැතවූ පදුම තෙරහුද; තිස්සත්ථෙරො, හැවක වසන තිස්සතෙරහුද; සාසනං අනුරක්ඛන්තො, සසුන් රක්නේය; ජම්බුදීපෙ පති

ඔතිණ්ණා, හෙළදිව මහණව දඹදිව්ගොස් බුදුවදන් උගෙණ ඔබ පිහිටි සසුන් රක්ඛෙන්ති; මග්ගකොවිදා; මාර්ගඥානයෙහි දක්ෂවූවෝ; විනය පිටකං තම්බපණ්ණියා දීපෙ පකාසෙසුං, (යනු පදසම්බන්ධයි)

## 5-6-7-8 වෙනි පිටුවල

(5) උප්පක්කමිත්වා, විකුම් කොට; (6) කායසංසග්ගං සමාපජ්ජන්තස්ස, කායසංසර්ගයක් කරන්නාහට; දුට්ඨුල්ලාහි වාචාහි, තුඑල් තෙපුලින්; ඔභාසන්තස්ස, කියන්නාහට; අත්තකාම පාරිචරියාය වණ්ණං, තමහට මෛථුන්දමින් මෙහෙකිරීමෙහි ගුණ; (7) සංචරිත්තං සමාපජ්ජන්තස්ස, මාගම් පිරිමින් අතුරෙහි හැසිරීම කරන්නාහට; සඤ්ඤාචිකාය, තමා ඉල්වාගත් උපකරණින්; මහල්ලකං, (කරවාදෙන හිමියන්ඇති) සඤ්ඤාචිත කුටියට වඩා මහත්හෙයින්ද ප්‍රමාණාතික්‍රමණය කිරීමෙන් හෝ මහත්වූ ප්‍රමාණයඇති හෙයින්ද මහල්ලක නම්වූ; විහාරවත්ථුං, ගෙබිම; සොධෙන්තා, හෙලි කරන්නේ; චෙතියරුක්ඛං, පුදන දෙවොල් රුකක්; අනුද්ධංසෙන්තස්ස, චොදනාකරන්නා හට; (8) අඤ්ඤභාගියස්ස, මනුෂ්‍යජාති භික්ෂුභාව කොටාශයන් අන්‍යවූ තිරශ්චීනජාති ඡකලකභාවාදි කොටස් ඇති; අධිකරණස්ස, දබ්බමල්ල පුත්‍රාදි නාමකරණයට වස්තුවූ ඡකලකාදීහුගේ; කිංචි දෙසං ලෙසමත්තං, ජාත්‍යාදිකිසි දෙශලෙශ මාත්‍රයක්; උපාදාය, චොදනා කරණු පිණිස ගෙණ.

සඟවෙසෙසි.

---

## 9-වෙනි පිටේ

රහො, නොපැනෙන තන්හිවූ; පටිච්ඡන්නෙ කවාට කුඩ්ඩ්‍යාදීන් මුවහවූ; අලංකම්මනීයෙ, මෛථුන සේවනයට යොග්‍යවූ; ආසනෙ, අස්නෙහි.

අනියතා.

---

## 11-13-14-15-16-වෙනි පිටුවල

(11) අතිරේක චීවරං, නොඉටු නොවිකැපූ සිවුර; සත්තරත්ත රෙත, හඳහා පොරෙතා පමණින්; අකාලචීවරං, නොකල්සිවුර; (13) අජ්ජනෙහා, අද එකදවස; අජ්ජුණෙහාතිවා.

කඨිනවග්ගො පඨමො.

---

කොසියකාරකෙ, තිහිරිවායන් තිහිරි වියන්නවුන්; අනාදින්නා, නොගෙණ; තූලං, හෝලයක්; ගොචරිකානං, කිඹුල්වන් එළලොම්

සම්බන්ධවූද (14) අනුවස්සං, අවුරුද්දෙහි අවුරුද්දෙහි; සමන්තා, හාත්පසින්; උජ්ඣිත්වා, හැර; සණ්දිසිංසු, ඉටු; රූපියං, රන්රිදීමසු කහවණු; (15) සංවොහාරං, පෙරළි කිරීමට; කයවික්කයං, පස්සහ ධැමියන් තබා සෙස්සවුන් හා ගණුදෙනුත්;

කොසියවග්ගො දුතියො.

---

චෙතාපෙන්තස්ස, පෙරලා හෝ කරවා හෝ විකිණ හෝ ගන්නාහට; අප්පමත්තකෙනපි භින්නෙන, බැම්මට මදව මදක් බුන් පමණිනුත්; බන්ධනෙන, එක් දෙබැමෑක් බැඳිපමණිනුත්; විලිඛිතමත්තෙනපි, හිරිවූ පමණකිනුත් නෙවත් හිරිහැඳුන පමණකිනුත්; (16) තන්තවායෙහි, පෙහෙරුන් ලවා; අච්චෙකචීවරං, ඉතා ඉක්මන් සිවුර.

පත්තවග්ගො තතියො

නිස්සග්ගියා.

---

## 17-18-වෙනි පිටුවල

(17) අවජානිත්වා, වළහා; පටිජානි, පිළිගත; පටිජානිත්වා, පිළිගෙණ; අවජානි, වැළකී; (18) ඔමසවාදෙ, උපසම්පන්නහට ජාත්‍යාදීන් සටා බිණීමෙහි; භික්ඛුපෙසුඤ්ඤෙ, භික්ෂූන් ඔවුනොවුන් කෙරෙහි ප්‍රියබව ශූන්‍යකරණ කේලාම් කීමෙහි; භණ්ඩනජාතානං, උපන් කලහ පූර්වභාගඇති; පදසො, පදවිසින්; සහ, සමග; කප්පෙන්තස්ස, කරන්නාහට;

මුසාවාදවග්ගො පඨමො

---

## 19-20-21-වෙනි පිටුවල

(19) භූතගාම, භූතයන්ගේ ගස්රුක්ලිය; පාතව්‍යතාය, කල කිරවීම නිමිත්තකොට ඡේදන භෙදනාදී යථාරුචි පරිභොගයෙනැයි සේයි. අඤ්ඤවාදකෙ, අනිකක් කීමෙහිද, විහෙසකෙ, විචාළදෙය නොකියා වෙහෙසීමෙහිද; (20) උජ්ඣාපනකෙ, ඉඳවීමෙහිද, අවමන් වෙන බස් බිණීමෙහි; ඛීයනකෙ, සියලු තැන නුගුණ පහළකොට බිණීමෙහිද; නොවඡං වා, බදවිලඑව්; අනුද්ධරිත්වා, තැන්පත් නොකොට; සෙය්‍යං, හෝනා නිදිනාදෑ; පුබ්බුපගතං, පළමු එළඹි; අනුපඛජ්ජ, උවසරට නොවැද, හමුවට නොඑළඹ; (21) ආහච්චපාදකං, වල් (වියල්) විදූ සිඑ මෙහෙයු; සහසා, නොවිමසා; විත්තිපරියායෙ, දෙතුන්තක සෙවින්නක්; අධිඨහිත්වා වදුරා කියා.

භූතගාමවග්ගො දුතියො.

**22-23-24-25-26-27-වෙනි පිටුවල**

(22) ආමිසංහතු, ආහාරපාෘයෙන්; එකඩානමගගං, එක්ව දුරු මග; සංවිධාය, බැණගෙණ;

ඔවාදවගෙගා තතියො

(23) පරිපාචිතං, මිහිකරවූ; විනයූයසි සේසි; ආවසථපිණ්ඩං, පින්කැමතියන්ගේ ශිම්නැති බත්; අනු ව සිකීි, වැසවැස; (24) අනතිරිත්තං, කැපනොකල; ගිලන්හට වැඩිනොවූ; අභිහඨුං, එලවා; සනතිධිකාරකං, පිළිගෙණතුබූ, යම්කැලි; (25) මුඛවාරං, මුව දෙරින් වැළඳියයුතු; ආහාරං, ආහාර; යම්කිසිඅහරක්; ආහරනත සස, වළඳන්නාහට;

භොජනවගෙගා චතුඤෙථා

සභොජනෙ කුලෙ, මෛථුනරාගයෙන් සමන්විත ස්ත්‍රීපුරුෂ දෙදෙනෙකු ඇතිගෙයි; (26) චාරිතතං, හැසිරීමට; හැසිරෙනබවට හෝ; උයයුතතං, සටනට සනනඩව නිකුත්; (27) උයෙයාධික සටත්කරණ;

අචෙලක වගෙගා පංචමො.

අංගුලිප්පතොදකෙ, ඇඟිලි තැහැටින් විදීම නිමිතතකොටගෙණ ගිරිහිකැවීම; උදකෙ හසසධමෙම, දියකෙලෙනා සවභාවයෙහි; හාසධමෙම වා:

**28-29-30-31-32-33-34 වෙනි පිටුවල**

(28) හිංසාපෙනතසස, බවන්නාහට; ජොතිං, ගිනි; සමාදහිතවා, දල්වා; විසීවෙනතසස, තප්නාහට; අනාදියිතවා, නොගෙණ නො කොට කප්බින්දු නොතබා; දුබබණණකරණං, නපුරු පැහැකිරීම.

සුරාමෙරය වගෙගා ජඨො.

(29) ජීවිතා, ජීවිතෙන්ද්‍රියයෙන්; වොරොපෙනතසස, ගලවන්නා හට; යථාධමමං, ධර්මයවූපරිද්දෙන් දූන; පුනකමමාය, නැවත කිරීම පිණිස; උක්කොටෙනතසස, උගුළුවන්නාහට; නිහතාධිකරණං, සන්හුන් අධිකරණය; (30) ථෙය්‍යසතෙථන, සොරවෙළඳුම් ගැල් සාත්තුවාහා; ගඩබාතිපුබබං, පෙර ගිජුලිහිනියන් මැරූ කුළෙහි උපන් ගිජුපැටිකුලෙහි උපන්; තථාවාදිනා, එසේම කියන; අක තානුධමෙමන, ඔසාරණය නොකළ;

ඝප්පාණක වගෙගා සත්තමො.

(31) තලඝට්ටිකං, අත් ඇත් ඔසවා පාත්නාහට අතුල්තෙලෙන් හයකරන්නාහට; (32) සුතිං, කියන තෙපුල් ඇසියහැකි තැන; උපතිඨ්ඨන්තස්ස, එළඹසිටිනාහට; ඛීයනධම්මං, බුමුණනාසවභාවය; ආපජ්ජන්තස්ස, කරන්නාහට බුමුණනබවට පැමිණෙන්නාහට හෝ; විතිවජ්ජිය කාලය; සන්නිට්ඨුහනට නිසිතෙපුල; වත්තමානාය, පවතිමින් සිටියදී.

**සහධම්මිකවග්ගො අට්ඨමො.**

(33) පුබ්බෙ අප්පටිසංවිදිතෙන, පළමු නොදන්වන ලදුව; අන්තොපුරං, යහන්ගබඩාවට; රතනං, නිසගිවත්; (34) තූලොනද්ධං, පුළුන් එව; කණ්ඩුපටිච්ඡාදි, කස්පිළිසන;

රාජවග්ගො නවමො පචිතිති.

**36-37-38-39 වෙනි පිටුවල**

(36) වොසාසන්තියො භික්ඛුනියො, ඇණවන මෙහෙණ; භික්ඛුනිං වොසාසන්ති ඉතිපාඨෝ යුත්තොති ගණ්ඨිපදෙ වුත්තං; සෙඛසම්මතානි සෙඛසම්මතලද; (37) ඔලම්බෙන්තෙන, එල්වමින්; සේඛියන්, මූල පචිතියෙහි ඇති සෙසින් දතයුතු; අනාදරියං පටිච්ච, අනාදර පිණිස; කීළාපෙන්තෙන, කෙළවන්නහු විසින්; (38) උක්ඛිත්තකාය, එක් පසකින් හෝ දෙපෙසින් හෝ නගනලද සිවුරු ඇතිව;

පරිමණ්ඩලවග්ගො පඨමො.

**උජ්ජග්ඝිකාය, මහසිනාසෙමින්; උච්චාසද්දං, මහහඬ; කායප්පචාලකං, කය සලසලා; උජ්ජග්ඝිකවග්ගො දුතියො,** (39) ඛම්භකතෙන, උකුළෙහි තබනලද අත් ඇතියාව; ඔගුණ්ඨිතෙන, හිස වසා පෙරව; උක්කුටිකාය, අගපල්ලෙන් හෝ විළුඹෙන් හෝ යන ගමන් ඇතියාව; පල්ලත්ථිකාය, අකවටුවේන්;

ඛම්භකතවග්ගො තතියො.

**40-41-43-44-49 වෙනි පිටුවල :—**

(40) ථූපකතො, මුදුනෙන්; ඔමද්දිත්වා, හනා; උජ්ඣානසඤ්ඤිනා, සිපිසිත් ඇතියාව; **පිණ්ඩපාතවග්ගො චතුත්ථො**

සකබලෙන, අකුරුපුරා නොකියහැකි පිඩුඇති මුවෙන්; පිණ්ඩුක්ඛෙපකං, ආලොප මුවට දම දමා; (41) කබළාවච්ඡෙදකං, ආලොපය කඩකඩාගෙණ; අවගණ්ඩකාරකං, කෙළ රැස්කොට කොට හෝ කොපුලැ පිඩුරැස්කොට කොට; හත්ථනිද්ධුනකං, අත සල සලා.

කබළවග්ගො පඤ්චමො.

සඝිතචීකං පතනධොවනං, හිඳුල්හුලු සහිත පාදෙවිදිය; ජඞ්ඝසුං, දූමු; ජඞ්ඝිංසුවා, බිමලූහු; සතළපාතිසස, කඩු ඈ ශසත්‍රගත් අත් ඇති; සුරුසුරුවගෙගා ජණ්ඩොපාදුකාවගෙගා සතකමො.

(43) අකඛාසිතෙ සරීරෙ, නොකෑ නිමිත්හි; යෙහුයෙ‍යනකඛ සිතේ, බොහෝකොට කනලද; වනනකානෙ මුඛෙ, අභාල මිශයෙහි; වලකට; අවජ්ජපනනං, නොපහරමින්; තිසෙසා ආපතතියො, නත්වර ඇවදීම නිසා කියනලදී. මාසකං, මදටයි; ථෙය්‍යසංඛාතං, සොර සිත් කොටසින්; (44) මනුසසවිගගහං, මනුෂ්‍යශරීරය; ඔපාතං, වළ; උලලපනෙතා, කියන්නේ; ඉච්ඡාපකතො, ඉච්ඡාවෙන් මඩනා ලද්දේ; පටිවිජානනතසස, දන්නාහට; ආදිදසස; නිසා,(49)භූතගාමං, භූතගාමය; පාතනෙතා, සිඳුනේ;

**50-52-78-80-84-85 වෙනි පිටුවල :-**

(50) ආරපපථෙ ආරපපථෙ, පුරාගෙණ ඉදිකටු නැගීමෙහි නැගීමෙහි; (52) සෙඩාගොපළකෙ, බොළපිත් යට පමණෙහි; උපරිපච්චයචාරෙ, මත්තෙහි ප්‍රත්‍යය වාරයෙහි; එකදෙශයෙන් දක්වා කියනපිණිස; පච්චයවචනානි, පච්චය ශබ්දය හා සොභා කීම්හු;(84) ධුරනිකෙඛ්පෙ සමනුභාසන සමුඩානයෙහියි; (78) පච්චාකතා, පරදවනලද්දී; (80) අතිරෙකවතුකකංස පරමං, සොලොස් කහවණුවක් වටනා; අඩ්ඪතෙය්‍ය කංසපරමං, දසකහවණුවක් වටනා (84)සංචානිකං, පස් දවසක්; සංඝාටිං, විවාරු වැළඳගත්තා විසිත් හෝ අව්කුවන විසින් හෝ සිවුරු පෙරළීම; චීවරසංකමනීයං, නොකියාගත් නැවත දිය යුතු සිවුර; (85) විභංගං, බෙදීම; සමණචීවරං, කප්බින්දු එබූ සිවුර; එකතඑරණපාපුරණෙ, පාවාරාදීන්ගේ එක් කෙළවරක් අතුට එක් කෙළවක් පෙරව හෙවීමෙන් එකක්ම ආසතරණ පාවරණ කොට ඇතිව; තුවටෙටනතීනං, කැටිව සයනය කරන්නවුන්ට; සමහර පොත්වල "එකතඑරණ පාපුරණෙ තුවටෙටනතීනං" කියාත් පාඨ ඇති ගැමපදෙහින් "එකතඑරණපාපුරණෙ, එකම අතුරෙයි එකම පොරවයි" යනු අර්ථය, එකතඑරණ පාපුරණයෙන් තම නොමනැවු කියා කියනලද, යෙදෙන්නක් ගතයුතු;

**94-95-102-104-121 වෙනි පිටුවල :—**

(94) සංඝාණිං, මෙවුල්දම් ඈ හිත පැළඳයුතු පළඳනා; ඉතඵා ලඞකාරං, ගැණුන් පැළැන්දයුතු යම්කිසි පළඳනා; (95) ගනිධවණෙණ කෙන, සුවඳින් පැයෙන් යුකතවූ උළනුයෙන්; වාසිතකෙන, සුවඳ කැවූ; පිඤඤාතකෙන, තලසූත්නෙන්; (102) අනොවසසකං, දිය හෙලුම; (104) උජ්ජවෙ උජ්ජවෙ, හුවන හුවන.

භික්ඛුනී විභංගං.

## 121 වෙනි පිටෙ

සබ්බෙ සංඛාරා, සියලු ප්‍රත්‍යය සමුත්පන්නධර්මයෝ; අනිච්චා ඇතිව නැතිවන හෙයින් අනිත්‍යයෝයයිද; දුක්ඛා, දුඃඛවස්තුකවූ හෙයින් දුඃඛයෝයයිද; අනත්තාච, අවශවර්තිතාපීයෙන් අනාත්ම යයිද; සංඛතා, ප්‍රත්‍යයසමුත්පන්නයෝයයිද නියමකරණලද; නිබ්බානංචෙව පඤ්ඤත්ති, නිර්වාණයද ප්‍රඥප්තියද යන මොහු දෙදෙන; අනත්තා ඉති, අනාත්මයෝයයි; නිච්ඡයා, නිශ්චයකරණ ලදහ; මේ සියලු නිශ්චය බුදුන් ඇතිහෙයින් වන්නේයි, එසේමැයි; බුද්ධචන්දෙ, කරුණාවෙන් සිහිල්වූ බුද්ධචන්ද්‍රයා; අනුප්පන්නෙ, නූපන් කල්හි; බුද්ධාදිච්චෙ, කෙලෙසඳුරු නසන බුද්ධ සූර්‍යයා; අනුග්ගතෙ, නොනැගිකල්හි, පහළනොවූ කල්හි; තෙසං, ඒ; සභාගධම්මානං, අනිත්‍යාදි ඒකාරණයෙන් සදෘශවූ ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්ගේ; නාමමත්තං, නම් පමණකුත්; ශික්ෂාපදධර්මයෝ යන නම් පමණකුදු; නඤ්ඤායති, නොපැනේ, නොදන්නාලැබේ; විවිධං, අනෙකප්‍රකාරවූ; දුක්කරං කත්වා, දුෂ්කරක්‍රියා කොට; පූරයිත්වාන පාරමී, සමත්‍රිංශත් පාරමිතාවන්පුරා; සබ්‍රහ්මකෙ, බඹුන්සහිත ලෙව්හි; චක්ඛුභූතා, ඇස්වූ; මහාවීරා, මහවීරයෝ; උප්පජ්ජන්ති, උපදනාහ; තෙ, ඒ තථාගතයෝ; දුක්ඛහානිං, දුක්නසන; සුඛාවහං, සුවඑළවන; සද්ධම්මං දෙසයන්ති, සද්ධර්මය යම්හෙයකින් දෙසද්ද එහෙයින්; අංගීරසො, රශ්මික්මෙන ශරීරඇති; සක්‍යමුනී, ශාක්‍යමුනිවූ; සබ්බභූතානුකම්පකො, සියලුසත්‍වයන් කෙරෙහි අනුකම්පාඇති; සබ්බසත්තුත්තමො සීහො, සර්වසත්වෝත්තමවූ මුනිශ්‍රෙෂ්ඨතෙමේ; මහාගුණං, මහානුසස් ඇති; සුත්තන්තං, සූත්‍රපිටකයද; අභිධම්මං, අභිධර්මපිටකයද; විනයංච, විනයපිටකයද යන; තිපිටකෙ දෙසයි, තුන්පිටකය දෙසූ සේක; විනයො, විනයපාලිය; යදිතිට්ඨති, ඉදින් අතුරුදන්නොව සිටියේවීනම්; එවං, එසේකල්හි; සද්ධම්මො, ප්‍රතිපත්තිප්‍රතිවෙධසද්ධර්මය; තිට්ඨති, පමුණුවන්නේයි කෙසේදයත්? උභතො ච විභංගානි, උභය විභංගයෝද; ඛන්ධකා, ඛන්ධකයෝද; යාවමාතිකා, යම් මේ මාතෘකාවක් ඇද්ද; ඔද, යනමොහු; සුත්තගුණේන, හුලණුවෙන් ගෙතූ; මාලාව, මල්මෙන්; පරිවාරෙන ගන්ථිතා, පරිවාරලණුවෙන් ගොතන ලදුව; (තිට්ඨන්ති, යම් හෙයකින්; සිටිද්ද;) තස්ස ච පරිවාරස්ස, එම පරිවාරයෙහි; සමුට්ඨානං නියතො කතං, සෙස්සවුන් හා සම්භෙදය නැති නියම සමුට්ඨානයද හෙවත් භූතාරෙචන චොරිමුට්ඨාපන අනුඤ්ඤත වශයෙන්; සෙස්සවුන්හා නුමුසුකොට, එකි එකීසිඛපද යෙනම වන්නේයයි නියම කරණලද නියත සමුට්ඨානයද; අඤ්ඤදං, එයින් අන්‍යවූ; සම්භෙදං, ප්‍රභෙද ඇති; (සමුට්ඨාදි) නිදානංච, ඒ ඒ

එයින් අන්‍යවූ; සභෙදං, ප්‍රභෙද ඇති; (සමුට්ඨානාදී) නිදානංච, ඒ ඒ සිඛපදයන්ගේ ප්‍රඥප්තිප්‍රභෙදයද; යන මොහු; සුත්තෙ දිස්සන්ති උපරි, යම්හෙයකින් මත්තෙහි සූත්‍රයෙහි පැනෙද්ද; ඉදිරියෙහි සමුට්ඨානවල පැනෙද්ද; තස්මා, එහෙයින්; ධම්මකාමො, විනයධර්මය කැමති ශික්ෂාකාමීවූ; සුපෙසලො, පියසීලීවූ මහණ තෙමේ; පරිවාරං සික්ඛෙය්‍ය, පරිවාරයෙහි හික්මෙන්නේයි.

විභඞ්ගෙ චීසු පඤ්ඤත්තං, යම්සිඛපදයෙක් උභය විභංගයෙහි පනවනලද්ද; උද්දිස්සන්ති උපොසථෙ, පොෂථ දිනයෙහි උදෙසද්ද; යථාඤායං, න්‍යායවූපරිද්දෙන්; පවක්ඛාමි සමුට්ඨානං, ඔවුන්ගේ සමුට්ඨානය කියමි; සුණාථ, මේ මාකෙරෙන් අසව්; ඉක්බිති සමුට්ඨාන තෙලෙස වෙන්කොට දක්වනු කැමතිව; "පාරාජිකං යං පඨමං" යනු යුහු; සෙස්ස පාලිකථා අවී නයින් යු ප්‍රකටයි;

## 125-126-129 වෙනි පිටුවල.

(125) අකතං, අම්ශ්‍රවූ; සමුට්ඨානං, සංක්‍ෂෙපවූ සමුට්ඨානය; හෙවත් සමුට්ඨානයෙහි සංක්‍ෂෙපය; දසතීනි සුදෙසිතං, තෙලෙසකැයි මනාකොට දෙසනලද; අසම්මොහකරං, මූලාබව නොකරණ; නෙත්තිධම්මානුලොමිකා, විනයපාලියට අනුලොම්වූ; ඉමං ඨානං මේ සමුට්ඨානය; ස්ථානය; කාරණය; ධාරයන්තො විඤ්ඤූ, ධරන්නාවූ විඤ්ඤූ තෙමේ; සමුට්ඨානෙ නමුය්හති, සමුට්ඨානයෙහි මූලානොවන් නේයි; (126) කති ආපත්තියො, කෙතෙක් ආපත්තීහු; විනීතවත්ථූනි, ඒ වස්තූන් සන්සිඳුවන වස්තූනු; සාරාණීයා, සිහිකටයුතු; ආපත්තික්ඛන්ධානි, ඇවත් කඳින්; ආරති විරති පටිවිරති වෙරමණී, වැළක්මය; අකිරියා අකරණං, ඔවුන්ගේ නොකිරීමය; අනජ්ඣාපත්ති, එයට නොවැදමය (නොපැමිණීමය) වෙලා අනතික්කමො, සීම නො ඉක්මීමය; සෙතුඝාතො, ඇවත් සේතූන්ගේ (විරතීන්) නැසීමද යන; අප්පමාදෙ, නොපමායෙහි; අගාරවො, ගෞරව නැත්තේද; පටිසන්ථාරෙ, ආමිසපටිසන්ථාර ධර්මපටිසන්ථාරයෙහි; යො හොති විවාදෙ බහුජන අහිතාය යනාදිය සුළුවග සමථක්ඛන්ධකයෙහි කී නියෙන් දතයුතු.

(129) ආවීචෙව, හමුයෙහිද; රහොච, නොහමුයෙහිද; කායකම්මං, කායක්‍රියාව; මෙත්තං පච්චුපට්ඨිතං, මෛත්‍රීන් යුක්තව එළඹසිටියේවේද; පියකරණො, ප්‍රියත්වය කරන්නේය; ගරුකරණො, ගරුකරන්නේය; සංගහාය, ඒ භික්‍ෂූන් විසින් සංග්‍රහකටයුතුබවට; අවිවාදාය, විවාද නොකරණ පිණිස; සාමග්ගියා, කායසාමග්‍රිය පිණිස; එකීභාවාය, සිතින් එක් බව පිණිස; ධම්මලද්ධා, දැහැමින් ලබනලදහුද;

පත්තපරියාපන්න මත්තමපි, පාත්‍රයෙහි අන්තර්ගතවූ පමණඇත්තේද; අප්පටිවිභත්තභොගිහොති, විභාගවත්කොට වැළඳීමඇත්තේනො වේද; සාධාරණභොගී, සාධාරණ වැළඳීම ඇත්තේවේද මුලපටන් දී ඉතිරිය වලඳද; යානිතානි සීලානි, යම් ඒ සීලකෙනෙක්; අඛණ්ඩානි, එක කොණකුත් කඩනොවූද; අච්ඡිද්දානි, මැදින්සිදුරු නොවූද; අසබලානි, පිළිවෙළින් දෙතුන් සිඛපදයක් බුබුත් හෙයින් කබර නොවෙද්ද; අකම්මාසානි, අතරතුරෙහි බොහෝ සිඛපද නොබිදුනු හෙයින් තිත්නොවෙද්ද; භුජිස්සානි, තෘෂ්ණාදාසව්‍යයෙන් මිදුන හෙයින් නිදහස්හුද; විඤ්ඤුප්පසත්ථානි, විශතුන් විසින් වණත් ලදහුද; අපරාමට්ඨානි, තෘෂ්ණා දෘෂ්ටින්නොගත්නාලදහුද; සමාධිසංවත්තනිකානි, උපචාරඅර්පණා සමාධි එළවද්ද; සීලසාමඤ්ඤගතො, තත්දෙස වසන පිරිපුන් සිල්ඇත්තන් හා සමබවටපැමිණි සිල්ඇතිව; යායංදිට්ඨි, යම් මේ මාර්ගසම්ප්‍රයුක්තදෘෂ්ටියක්; අරියා, නිදෙස්ද; නීය්‍යානිකා, නිර්වාණ ප්‍රාපකද; තක්කරස්ස, ඒ අනුශාසනය කළහුගේ; සම්මා, මොනොවට; දුක්ඛක්ඛයාය; දුක්නැසීම පිණිස පවතීද; උදානගාථාවෙහි:-

> ආපත්ති ආපත්තික්ඛන්ධා විනීතා සත්තධා පුන,
> විනීතා ගාරවා චෙව ගාරවා මූලමෙවච;
> පුන විනීතා විපත්ති සමුට්ඨාන් විවාදනා,
> අනුවාද සාරණීයං භෙදාධිකරණෙනච,
> සත්තෙව සමථාවුත්තා පදසත්තරසා ඉමෙ; යි

කියාත් ගාථා පඩක්තියෙක් ඇත; එහි පද තුදුසය, ඒ ගාථාවල උද්දෙශ ක්‍රමයෙන් කියනලදී, උද්දෙශයෙහි පද තුදුසය, නිද්දෙස යෙහි පද සතළොසයි; ඒ නිද්දෙසයෙහි සතරවනුව කී සත්ත ආපත්තිවාරයද පස්වන සත්තාපත්තික්ඛන්ධවාරයද සවන සත්ත විනීතවත්ථුවාරයද මුල කී පංච ආපත්තිවාර පංච ආපත්තික්ඛන්ධවාර පංච විනීතවත්ථුවාරයෙහි යථා ක්‍රමයෙන් ඇතුලත්කොට එහි එහි බහා තුදුසක් කොට කියනලදී. නිර්දේශක්‍රමයෙනුත් සතළොස් පදය පුරාත් පැනෙන ගාථා ඇත්.

## 131-135-142-143-149-වෙනි පිටුවල:-

(131) සාරම්භං, කිපිල්ලිකාසයාදි උපද්‍රව සහිතවූ; අපරික්කමනං, ගොන් යෙදූ ගැලක් වට නොයාහැකි හෙයින් උපචාරරහිතවූ (135) අනන්තදස්සිනා, අනන්තදර්ශීවූ; ලොකහිතෙන විවෙකදස්සිනා, තදඞ්ග විවෙකාදි පංච විවෙකයන් දක්නාවූ ලොකහිතවූ තථාගතයා විසින්; කායිකා සමුට්ඨානා අකඛාතා, යම් කායිකසමුට්ඨාන යෙක් කියනලදද; තෙන, එයින්; කති ආපත්ති සමුට්ඨිතා, කෙතෙක්

ඇවැත්හු වේද්ද; විභංගකොවිද, විභංග ශාසනයෙහි දක්‍ෂය; තං පුච්ඡාමි, තා විචාරමි; බ්‍රෑහි, කියා; සමුට්ඨානා කායිකා අක්ඛාතානි එත්ථ යං කායිකං සමුට්ඨානං අක්ඛාතනානි ලිඞ්ගවිපල්ලාසෙන අත්ථො වෙදිතබ්බො තෙ තෙවාහ තෙනාහි එවමුපරිපි (142) සතිසම්මොසා සිහිමුළාවෙන් අඥදුවිහිතව; (143) තබ්භාගියා, ඒ කොටස්වූද; අඤ්ඤභාගියා, ඒ කොටස නැත්තෝ (නුවූවෝ) (149) සංසට්ඨා, මුසුහු; විනිබ්භුජිත්වා, බිඳ වෙන්කොට; තා තා කරණං පඤ්ඤපෙතුං, නානත්ථාය පනවත්තව; ලබ්භාව, පනවනු ලැබේද; සො, හෙතෙම; මා හෙවනාති, එසේ නොකියයි; වචනීයො අස්ස, කියයුතුවන්නේයි; තන්නු වුත්තං, වදාරණලද්ද වේද; සමථා, අධිකරණයෙහි සමථයෝ; සම්මනාති, සංවෙත්; සතිවිනයොපි අමූළ්හවිනයොපි තස්ස පාපිය සිකාපි තිණවත්ථාරකොපිති ඉමෙ කිච්චාධිකරණෙන සම්මනාති,

## 154-155-156-158-159-160-වෙනි පිටුවල:-

(154) යථාකථංවිය, කෙසේද, (155) යං භණ්ඩනං, යම් කලහ පූර්වභාගයෙක්; කලහො, කලහයෙක්; විග්ගහො නානාවාදො, කී නොකී බිඳෙන්නට නිසි තෙපුල් කීමෙක් අධර්මයෙන් තෙපුල්කීම අඤ්ඤථාවාදනම් වේ, කීහාටි පිළිවක්ව කීම පච්චනාය වොහාරනම් වේ. මෙධකං, කලහයෙක් ඇද්ද; විවාදාධිකරණං විවාදාධිකරණයෙක්; සංඝො, සංඝතෙම; විවදති විවාදාධිකරණං, විවාදාධිකරණවූ විවාදය කෙරේද; එවං සෙසෙසුපි, අනුවදනා, කියන බැවෙක්; අනුල්ලපනා, පහළකොට කීමෙක්; අනුභණනා, පෙරළපෙරළා කියනා බැවෙක් නුසුත් තෙපුල් ඇතිබැවෙක්; අනුසම්පවංකතා, එහි නැමුනුබැවෙක්; අබ්භුස්සහනතා, උත්සාහ ඇතිබැවෙක්; අනුබලප්පදානං, බලදීමෙක් උපස්තම්භවීමෙක් ඇද්ද; කිච්චයතා, කම්යන්ගේ කටයුතු බැවෙක්; කරණීයතා, ජනූරහයෙන් කටයුතු බැවෙක්; (156) කතමං අධිකරණං උපනිස්සිතං, කවර අධිකරණයක් ඇසුරුකෙළේද; කතමං අධිකරණං පරියාපන්නං, කවර අධිකරණයෙකි ඇතුළත්ද; කතමෙන අධිකරණෙන සංගහිතං, කවර අධිකරණයෙන් සංග්‍රහකරණලද්ද ගන්නා ලද්ද; සනිදානං, නිදාන සහිතවූ; උත්පත්තිස්ථානයසහිතවූ; (158) සනිද්දිසං, නිදෙස්සහිතවූ; විභංග නිර්දේශ සහිතවූ; උපසම්පදං, පබ්බජ්ජාක්ඛන්ධකය, පුච්ඡිස්සං, විචාරමි; උක්කට්ඨපදානං, උතුම් පදයන්ගේ; ඇවත්පැනවූ පදයන්ගේ; කති ආපත්තියො, ආපත්තීහු කීදෙනෙක්ද? සනිදෙදස චාතිපිපාථො, සමාචාර, වත්කන්ද; (159) ඨපනං, පාතිමොක්ඛඨපනකන්ද; (160) සප්පටිකම්මා, ප්‍රතික්‍රියා සහිතවූ; සාවජ්ජා, සාපරාධ; කිරියාකිරියතො, කිරීම නොකිරීමෙන්; අපරාපත්ති, පිරිවෙස් පුරමින් වත්

ඇවැත්; පුබ්බාපත්තීනං, අපරාපත්ති මූලායපටිකස්සනායෙහි; අපරාපත්තීනං, අන්තරාපත්තිමානත්ත පුරමින්; ආදිකරො, ආදිකම්මිකවූ; අධිච්චාපත්තිකො, සලසා අවදනා ඇවත්ඇති; අභිණ්හාපත්තිකො, එක්වන් අවදනා ඇවත් ඇති; චුදිතකො, චොදනාව ලබන්නේයි; නියතො, මිච්ඡත්තනියතවූ හෝ සම්මත්ත නියතවූ. ඒ දෘෂ්ටිසම්ප්‍රයුක්ත සතර සිත හා දෙව්නස් සහාගිය දෙසිත මිච්ඡත්ත නියත නම; මාර්ගසම්ප්‍රයුක්ත සතර සිත සම්මත්ත නියත නම, සෙසු එකූනසූ චිත්තයෝ අනියත නම්හුයි; භබ්බාපත්තිකො, ඇවතට අවදනට හබ්බවූ; ඨපනං, පාතිමොක්ඛඨපනය.

ඒකකං නිට්ඨිතං.

---

## 161-162-163-164 වෙනි පිටුවල:-

(161) සඤ්ඤාවිමොක්ඛා, සංඥාවෙන් මිදීම ඇති; නොසඤ්ඤාවිමොක්ඛා, සංඥාවෙන් මිදීම නැති; අත්ථාපත්ති, ආපත්තිය ඇති; පටිසඤ්ඤුත්තා, පිළිබඳ; සපුග්ගලා, තමා පුගුලන්; වෙහාසංගතො, ආකාශස්ථවූයේ; අරුණග්ගෙ, අරුණ නැගීමෙහි; චාතුද්දසියො ච පණ්ණරසියො ච චාතුද්දසිකො ච පණ්ණරසිකො ච චාතුද්දසියා චාතුද්දසිකා.

(162) කම්මෙන වා, එකකම් එකොද්දෙශයෙන් හෝ; අඩ්ඪානහීනො, උනුවිසිවස් ඇත්තේයි; වත්ථුවිපන්නො, නටවස්තු ඇත්තේයි; කරණදුක්කටකො, මාතුඝාතාදි තපුරු ක්‍රියා කෙළේයි; පරිපූරෙපි, පිරුණු පාසිවුරු ඇත්තේයි; නිස්සාය, නිසාවිසීමෙන්; බාලස්ස ච දහරයාට ද; සාතිසාරං, සාපරාධවූ; කායෙනවා, හස්තවිකාරාදි කයින් එව්; අප්පත්තො, නොපැමිණි දෙස්; පටිඤ්ඤා, දුන්වීම්; සික්ඛූපඝාතිකා ච, ත්‍රිවිධ ශික්ෂාවෙහි නොහික්මීමෙන් සිඛ නසන්නේයි; භොගූපඝාතිකා ච, දුෂපරිභොගයෙන් වළඳ කරන්නේය; (163) සීස, කළුතුඹ; සම්බුක, සම්බුකයෙන්; සෙතුඝාතො, හෙතුනැසීම; ජාතිමං, ජාතිලුණුතෙමේ තමාමවූ ලුණු; කාරිමං, දියසිඳකෙළේයි; සාමුද්දං, පියවි ලුණු; කාලලොණං, බලල් ලුණු; සින්ධවං, ශෛන්ධව; උබ්භිදං, වැලිගැරූ ලුණු; රොමකං, එනම් රට උපන් ලුණු; පක්කාලකං, යවකාර ලුණු; (164) න කුක්කුච්චායිතබ්බං, කුකුස් නොකට යුත්තේයි.

දුකං.

---

## 165-167-168-169-170 වෙනි පිටුවල:-

(165) තිඨනෙන, සිටිනාකල්හි; සමඞ්ගී, යුක්තවූයේ; අදුක්ඛම සුඛාවෙදනා, උපෙක්ෂා වෙදනාවෙන්; පටිච්ඡන්නානි, පිළිසත්වද; වහනනි, ඡවතින්; විවටානි, ප්‍රකාශවූවෝ; තථාගතප්පවෙදිතො, බුදුන් විසින් පසක් කරණලද; (167) අනාපදනො, එයින් වැලක් නැත්තේ; අගාළ්හාය, තදබව පිණිස; බලවත්බව පිණිස; චෙතෙය්‍ය, යත්න කරන්නේයි; (168) ආචාරවිපනෙනා, නට ආචාර ඇත්තේද; උපඝාත, නැසීම තොගික්මීම උපඝාත වෙයි; ඔමද්දිත්වා, මැඩ; අලං, තොකමැත්තේයි; (169) සවචනීයං නාදාතබ්බං, තෙපුල් තොගත යුතු තොඇසියයුතු; අනුයොගො, පුච්ඡාවිස්සජ්ජනය; සාකච්ඡා නකාතබ්බා, සංසඳනය තොකටයුතුයි; තයො, තුන්දෙනෙක්; ඉදමප්පහාය, මේ බ්‍රහ්මචාරිපටිඤ්ඤාදි ලබ්ධිය තොහැර; ආපායිකා නෙරයිකා, යොච, යමෙක්; අබ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරි නුවූයේ; බ්‍රහ්මචාරිපටිඤ්ඤෙ, බ්‍රහ්මචාරීමි යන ප්‍රතිඥ ඇත්තේද; පරිසුඬ බ්‍රහ්මචරියං චරන්තං, පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙණ; සුඬං බ්‍රහ්මචාරිං, ක්ෂීණාශ්‍රවයාහට; යො, යමෙක්; නත්ථි කාමෙසු දොසොති, කාමසේවනයෙහි දොස් නැතැයි; එවං වාදී, මෙසේ කියාද; එවං දිඨී, මෙබඳුවූ ලබ්ධිය ඇතිව; කාමෙසු, කාමයන්; පාතබ්‍යතං, සෙවුනා බවට; ආපජ්ජති, පැමිණේද; අයං ච, මේද; (170) ආපායිකො නෙරයිකො, තික භොජනං, තුන්දෙනා එක්ව ගන්නා බොජුන් සතරදෙනා එක්ව ගණුත් ගණභොජනයෙන් ඇවැත්වෙයි තුන් දෙනාට එයින් නොවෙයි; කුලානුද්දයතා ච, කුලානුග්‍රහයෙන්ද; කප්පකො, කප්සිටිනා කමීඇත්තේද; ඔරමත්තකෙන, ස්වල්පමාත්‍රවූ; අන්තරාවොසානං ආපාදි, අතුරෙහි නිෂ්ඨාවට ගියේයි; අසංකමණීයා, අනාගමනය හැකි; සමුද්දංඑනකො, මුහුදු පෙනයි, සිරිකැටයෙන් මේ.

තිකා නිඨිතා.

---

## 172-173-174-175 වෙනි පිටුවල:-

(172) ලිඞ්ගපාතුභාවෙන නිමිතිපහළවීමෙන්, ලිඟුපෙරලීමෙන් යුසේයි; සහසපිලාභෙන, මාගම් ලිඟු පිළිලැබීම හා සමග; පුරිමං ජහති, පළමු පිරිමි ලිඟු හරි; පච්ඡිමෙ, මාගම් ලිඟුයෙහි; විසුද්ධත්තියො, විශුද්ධවිඥපතිනු; සාමුක්කංසිකා, තමන්ම උස්වාතුබූ; ඡාරිකා, හළු; පරිසද්දූසකා, පිරිස් නසන්නෝ; සොභනා, සදන්නෝ; සොබවන්නෝ; (173) වත්ථුනානත්තතා, වස්තුහුගේ නානත්‍වයෙන්

අවදනා ආපත්තිය; වචනාගෙරා, පච්චයා, සතර කාරණයකින්; වසසවජ්දසස, වස්බුත්තනාහට; මහතාභාසා, පරීක්ෂාකොට කීමයි; (174) සංදස්සනා, දක්වීමයි; පටික්ඛෙපො, පිළිකීමයි; (176) භික්ඛූනො, භික්ෂූන් කෙරෙන්; අනුයොගො, පුච්ඡාවිස්සජ්ජනය.

චතුක්කා.

---

## 176-177-178-179-180-181 වෙනි පිටුවල;-

(176) න උපෙති, නොපැමිණේ; නොඅරා, ගණභොජනං බතින්. නිමැතුනැත සතරදෙනා ගැන්මය; පරම්පරා භොජනං පරවුරු බොජුන් හෙවත් ගණව පිළිගත්තා භොජනය ගණභොජන නම; ඔදනෙන නිමන්තනම් යනාදීන් අකප්ප වචනයෙන් බොහෝදෙනා පැවරූකල්හි පැවරූ පිළිවෙළින් නොවළඳ උපපටිපාටියෙන් වැළඳීම පරම්පර භොජන නම්වේ; අකුප්පධම්මොඅපි ඝීණාශ්‍රවවූයේත්; පාපභික්ඛූනි, ලාමක මහණුයයි; උස්සඞ්කිත පරිසඞ්කිතො හොති, ජනයා විසින් සැක පිළිසැක කරණලද වන්නේය; ගොචරෙරා හොති, ගෙ දූරූ බිම්කොට ඇත්තේවේද; සුසුකාචනං, කිඹුල්වසායි; බ්‍යසනානි, පීඩාවෝ විනාශයෝ; සම්පදා, සමෘද්ධීනු; පාපණිකං, අවන්මිදුලගුළුවත; උපජුර, මීයන් විසින්; අජකඛායිත, එළුවන් විසින් (කනලද) ද්‍රූ, තුඹස් පොරවූ; ආභිසෙකිකං අභිෂේක මඩුවෙහි හළපිළි, නහන මඩුවෙහිළුවී; ගතපච්චාගතං, මළසිරුරු පොරවා සොහොනට ගෙණගොස් පෙරළා ගෙණා කඩ; (177) අවිදිතං, පිළිගත්මියි නොදන්නාලද; මජ්ජදිතං, රාදන; සමජ්ජදිතං, නැටුම් ආදීන්ගේ දීමය; උසභදිතං, දෙනුන් හා ගොන් දීමය; ඉත්ථිදනයන් එසේමැයි; දුප්පටිවිනොදයො, නොසන්හිඳවිය හැක්කෝයි; පටිභානං, හිතින් සිතූදෙය; උපව්‍ණාති, රැස්කෙරෙයි; න උග්ගණ්හාති, මේ වස්තුවෙහි මෙතෙක් අව ලැබෙයි නොදනීද; භාසපරියන්තං න උග්ගණ්හාති, මේ ගතයුතු තෙපුල මේ නොගත යුතු තෙපුලයි ප්‍රයොජන නොදනීද; බාලොතෙව, බාලයයිම; (178) අනුසන්ධිවචනපථං, කථාමාර්ගීය; පුබ්බාකුසලො න හොති, පළමුකොට කියයුතු කථාවෙහි දක්ෂ නොවේද; අකාලඤ්ඤූ, කියයුතු කථාවට කල් නොදනීද; (179) මන්දත්තා, නුවණ නැති බැවින්; මොමූහත්තා මූළ්‍හබැවින්; උම්මාද, උමතුව; ඉදමසි නංයෙව, මෙහින් කායයී ඇති බවම; (180) විඤ්ඤූ, විඥයො; අනුවිච්ච, දැන; පාසාදිකො, ප්‍රසාදකර බැවෙකි; (181) අනාමන්තචාරො, නොපිළිවිසැ ගම්වද්දමෙන් වන ආපත්තියෙන් ඇවත් හැත්තේයි; කාමසංකප්පබහුලො, කාමවිතර්ක බහුලකොට ඇත්තේයි; අතිවෙලං, කල්යවා; ඉම් ඉක්ම; අභිණ්හ

දසසන්නං, එක්වන් දක්ම; ඔතාරො, කෙලෙසුන්ගේ ඇතුලට බැස ගැන්ම; කෙලෙසුන්ට අවසරය; පාටිකංඛං, කැමතිවිය යුතුයි; අල්ලී බ්ජං, පුරුක්බිජු; විසුඛියො, විසුඛිනු; පකතානං, මඛනලද්දවුන්ට;

ප ඤ්ච කං.

---

### 183-184-185-186-188 වෙනි පිටුවල:-

(183) හිරිමා, පාපයෙහි ලජ්ජා ඇත්තේද; ඔත්තාපී, පාපයෙහි භය ඇත්තේද; ආභිසමාචාරිකාය, උභය විභඞ්ගයෙහි; ආදි බ්‍රහ්ම චරියකාය, දෙළුයෙහි;

ජ ක්‍කං.

---

(184) භික්ඛුස්ස නහොති ආපත්ති දඬ්ඩබ්බා, භික්ඛුස්ස හොති ආපත්ති දඬ්ඩබ්බා, භික්ඛුස්ස හොති ආපත්ති පටිකාතබ්බා යන ත්‍රික යයි. අභිචෙතසිකානං, උපචාරධ්‍යාන චිත්තයෙහි උපන්; දිඪධම්ම සුඛවිහාරානං, ඉහාත්මයෙහි සුවවිහාරවූ; චතුන්නං ඣානානං, ධ්‍යාන යන් සතරදෙනාගේ; නිකාමලාභී, කැමතිලෙසම ලාභීද; කැමති කැමතිවිට සමවදනාලෙස ලදද සමවදනට පොහොසත්ද; අකිච්ඡ ලාභී, සුවසේ නිදුකින් සමවදනට නිසිව ලැබීම ඇත්තේ; (185) අකසිරලාභී, අකසිරවූ මහත්වූ ඒ ධ්‍යානයන්ගේ ලාභය ඇත්තේද; අනායාසයෙන් සමවැද පිරිසුන් කල්වූ පරිද්දෙන් නැගෙන්නට නිසිද; ආසවානං ඛයා, අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන්ගේ නැසීමෙන්ම; අනාසවං, ආශ්‍රවයන් නැති; චෙතොවිමුත්තිං, චෙතොවිමුත්ති නම්වූ රාගපාපයෙන් විනිර්මුක්තවූ අර්හත්ඵලසම්ප්‍රයුක්තවූ සමාධියටද; පඤ්ඤාවිමුත්තිං, අවිද්‍යාවෙන් මිදිසිටි එම අර්හත්ඵල සම්ප්‍රයුක්තවූ ප්‍රඥාවිමුක්තියටද; නොහොත් සමථ ඵලවූ චෙතොවිමුක්තියටද; පඤ්ඤාවිමුත්තිං, විදර්ශනා ඵලප්‍රඥාවටද; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මයෙහිම; සයං අභිඤ්ඤාය, තෙමේම තමාගේ නුවණින් දැන; සච්ඡිකත්වා, පසක් කොට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වෙසේද; අනෙකවිහිතං, අනෙකප්‍රකාරවූ; පුබ්බෙ නිවාසං, පෙරවිසූ කඳ පිළිවෙළ; සෙය්‍යථිදං, ඒ කවරේද? අනෙකෙපි සංවට්ටකප්පෙ, නොයෙක් දේ හටගන්නා කප්හිද; විවට්ට, නස්නා; අමුත්‍ර ඔරතැන එවං නාමො, මෙසේවූ නමැත්තෙම්; එවං ගොත්තො, මෙබඳුවූ ගොත් ඇත්තෙම්; එවං වණ්ණො, මෙසේවූ පැහැයක් ඇත්තෙම්; එවමාහාරො එවං සුඛ දුක්ඛපටිසංවෙදී, මෙසේවූ ආහාර ඇත්තෙම්,

මෙසේවූ සුවදුක් අනුභවකරන්නෙම්; එවමායුපරියන්තො, මෙප්‍රමාණ ආයු කෙළවරකොට ඇත්තෙම්; ආසිං, වීමි; සො, ඒ මම; තතො චුතො, එයින් චුතවූයෙම්; අමුත්‍ර උපපාදිං, ඔරතැන උපන්මි; තත්‍රාපි, එහිදු; ඉධූපපන්නො, මෙහි උපන්මියි; ඉති, මෙසේ; සාකාරං, ආකාර සහිතවූ; සඋද්දෙසං, උද්දෙශ සහිතවූ; අතික්කන්තමානුසකෙ, මිනිස් ඇස ඉක්මසිටියාවූ; පණීතෙ, උතුම්වූ; සුවණ්ණෙ, පැහැපත්වූද; සුගතෙ, සුන්දරස්ථානයට පැමිණියාවූද; යථාකම්මූපගෙ, කර්මවූපරිද්දෙන් පැමිණියාවූද; වත, ඒකාන්තයෙන්; ඉමේ භොන්තො සත්තා, මේ භවත් සත්හු; අරියානං උපවාදකා, ආර්‍ය්‍යෝපවාදය කළෝය; (186) මිච්ඡාදිට්ඨිකා, සිස් දෘෂ්ටි ඇත්තෝය; මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, අනුන් ඒ මිථ්‍යාදෘෂ්ටි කර්මයෙහි සමාදන් කරවීම ඇත්තෝය; තෙ කායස්ස භෙදා පරම්මරණා, ඔහු කාබුත් මරණින් මත්තෙහි; අපායං, පහවූ සැපඇති; දුග්ගතිං, දුෂ්ටවූ ගතිඇති; නිරයං උපපන්නා, නරකයෙහි උපන්නෝය පැමිණියෝය; සමන්නාගතා, යුක්තයෝය;

සත්තකං නිට්ඨිතං.

---

(187) දූතෙය්‍යඞ්ගානි, දූතය අඟහු; අට්ඨකං (188) ආඝාතවත්ථූනි ක්‍රොධවස්තූහු; ආඝාතපටිවිනයා, ක්‍රොධ නැසුම්හු; නවමං.

---

## 190-191-192-193-195 වෙනි පිටුවල :-

(190) න විනිච්ඡය කුසලො, විනිශ්චයෙහි දක්‍ෂනොවේද; රාජන්තෙපුරප්පවෙසනෙ, රජුගේ ඇතුළුපුරයට වැදීමෙහි; (191) වුඩ්ඪාපන, මහලු පැවිදිකරණ. දසකං (192) සුඛං සුපති යනාදියන් මුල කීයෙන් දතයුතු; උදාන ගාථාහි, ඤාතධම්මෙන, දත්නාලද සියලු ධර්මයන් ඇති; තාදිනා, අෂ්ටලොකධර්මයෙහි අකම්ප්‍යවූ; ධීරෙන, ධෛර්‍ය්‍යවත් තථාගතයා විසින්; සබ්බසත්තානං හිතාය, සියලු සතුන්ට හිතපිණිස; විමලා, නිර්මලවූ; එකුත්තරිකා, එකුත්තරික නයහු; දෙසිතා, දෙසනලදහු; එකුත්තරිකං; (193) කො ආදි, ආදිය කවරේද? කිං මජ්ඣෙ; මධ්‍යය කවරේද? කිං පරියොසානං, (195) දුම්මඞ්කූනං පුග්ගලානං, නොමනා පුද්ගලයන්ට; අත්ථවසෙ පකරණෙ, අර්ථ කොට්ඨාස ප්‍රස්තාවයෙහි; අත්ථසතං, සංඝසුට්ඨුතාය සංඝඵාසුතාය යනාදියෙහි සංඝඵාසු යනාදි අර්ථපදයන්ගේ වශයෙන් අර්ථසිද්ධි සියයෙක්ද; ධම්ම සතං, සංඝ සුට්ඨු යනාදීවූ මූල පදයන්ගේ වශයෙන් ධර්මසිද්ධි සියයෙක්ද; වෙ නිරුත්තිසතානිච; අර්ථශතයෙහි නිරුක්තිශතය ධර්මශතයෙහි නිරුක්තිශතයයි යන

නිරුක්ති දෙසියයද; චත්තාරිඤාණසතානි, අභිධර්මභාජනීයෙහි පැවති ඤාණ සතාර ධම්ශතාර හා නිරුක්ති දෙසතයෙහි පැවති ඤාණ සතුයෝ තුන්දෙනදැයි ඤාණසතයෝ සතරදෙනද දතයුත්තාහුය;

මහා වග්ගො.

---

භික්ඛූනං සොළස එතෙ, භික්ඛුවිභඞ්ගයෙහි පුච්ඡාවාර අටය පච්චයවාර අටයයි සොළසය; එසේම භික්ඛුනීවිභංගයෙහිත් සොළසය; පෙය්‍යාලා,*අනන්තර පෙය්‍යාලය; භෙද, සමථ භෙදය; එකුත්තරිකමෙවච; කෙළවරකී එකුත්තරිකනයය; පවාරණාඛවසිකා, ඊට ඉක්බිතිව කී අභිවශවාරයයි මේ මහාවගී සංග්‍රහයයි. මුල පටන් මෙතැන් දක්වා මහාවග්ග නම්වේ.

## 196-197 වෙනි පිටුවල:-

196 ආසිංසමානරූපොව, කිසිවක් පතන සවභාව ඇතිව-පතනුවන්ව; කිස්ස, කවර කාරණයකින්; ඉධමාගතො, මෙතනට අයිද; මීසු විනයෙසු, භික්ෂු භික්ෂුණී දෙවිභංගයෙහි; යෙ පඤ්ඤත්තා, යම් සිඛපදකෙණෙක්; කතිහොන්ති, කෙතෙක්දෙන වෙද්ද; තෙ, තාගේ උම්මග්ගො, නුවණ ඉසනැගීම-ප්‍රඥාශීඝ්‍රය; භද්දකො, උතුම්; යොනිසො, නුවණින්; "උග්ගො"යි කියාත් පොත්වල පාඨ ඇති; තගඝ, එබැවින්; යථාපි කුසලා, දක්ෂයෙක් යම්සෙ පද; අඩ්ඪුඩ්ඪසතානි, තුන්සියපනස්දෙනෙක්; ඉංඝමෙ, එබැවින් මට; බ්‍යාකර, විසඳ, කිය; නිසාමයිත්වා, අසා; තො, අපට; පුච්ඡිතො, විචාරණලද්දෙහි; ජලඹනාතීති සතානි සබ්බෙ, සියලු දෙසියයසූවනුසිඛයෝ; යථාකථං, වූපරිද්දෙන්; කාළක, හුදු කළු එළලොම් සිඛ; අවෙලකා, අචෙල කස්සවා යන සිඛ; අකොකාසො, "යා පන භික්ඛුනී භික්ඛුං අකොකාසෙය්‍ය" යන සිඛ; වෙ අනුඩංසනා, අමූල අඤ්ඤභාගිය දෙන්න; වෙපිච භෙද, සංඝභෙදය භෙදනුවත්තකය යන දෙන්නද; අනන්තරවාසකො, නොනැමෙහෙණ අත්තින් සිවුරුපිළිගන්නා සිඛ; රූපියා, රූපිය සංවොහාර; සුත්තං, සාමං සුත්තං විඤ්ඤ පෙත්වා යන; උජ්ඣාපනෙ, උජ්ඣාපනකෙ ඛියනකෙ යන; පාචිතපිණ්ඩං, භික්ඛුනී පරිපාචිතං පිණ්ඩපාතං යනාදි; විකාලභොජනං, චාරිත්තං, නිමන්තිතො සභත්තො යනාදි; නහානං, ඔරෙනඩමාසං යනාදි; චීවරං දත්වා, සමග්ගෙන සංඝෙන චීවරං දත්වා යනාදි; වොසාසන්තී, තත්‍ර වෙසා භික්ඛුනී; ගිරග්ග, යාපන භික්ඛුනී නච්චං වා ගීතං වා යනාදි; චරියා, යාපන භික්ඛුනී අනොවස්සං චාරිකං පක්කමෙය්‍ය යනුද වස්සං වුත්ථා චාරිකං පක්කමෙය්‍ය යන දෙකයි; තඤ්ඤෙව, ඒ

රාජගහයෙහිම; [ඡන්දදානෙන, පාරිවාසිකෙන ඡන්දදානෙන යන සිඛායයි; පාරාජිකානි චත්තාරි, භික්ෂුණීන්ගේ සතර පරිජින; සංඝාදිසෙසා සොළස; සුක්කවිස්සට්ඨි, චෙ දුට්ඨදොස, අත්ත කාම, චාරිත්ත, කුලදූසන, යන මේ සඟ වෙසෙස් සයද භික්ෂුණීන්ගේ සඟ වෙසෙසින් දසයෙක්දැයි සොළසයි; (197) ඛුද්දකානි, කුදු පාචිත්තියයෝ; ඡපඤ්ඤසසතඤ්චෙව, එක්සිය සපනසෙක්ද; කුටි, සඤ්ඤාචිකකුටි; සෙය්‍යාච, අනුපසම්පන්නෙන සහසෙය්‍යං යන සිඛද ඛණනෙ, පඨවිඛණන; ගච්ඡදෙවතෙ, භූතගාමපාතව්‍යතාය යන සිඛද; මහාවිහාරෙ, මහල්ලකං පන භික්ඛුනා විහාරං යනුද; දෙව වස්සං, දුබ්බවයද; අඤ්ඤං, අඤ්ඤවාදකෙ විහෙසකෙ යනුද; වාරං, යාව, වාරකොසා යනුද; අනාදරියං, අනාදරියෙ යනුද; සහධම්මො, සහධම්මිකං වුච්චමානො යනුද; පයොපානෙන, සුරුසුරුකාරකං යනුද; එළකලොමානි, එළකලොමානි ධොවාපෙය්‍ය යනුද; පතෙනා ච, ඌනපංචබන්ධනෙන යනුද; ඔවාදෙ, භික්ඛුනූපස්සයං උපසංකමිත්වා යනුද; භෙසජ්ජං, තදුත්තරිං භෙසජ්ජ විඤ්ඤාපනං ච යනුද; සූචි, අඞ්ගවාසං වා යනුද; ආරඤ්ඤකො චෙව, යානි ඛො පන තානි ආරඤ්ඤකානි යනුද; ඔවාදො, යා පන භික්ඛුනී ඔවාදාය වා යනුද; සමාදහිත්වා විසිබෙන්ති, ජොතිං සමාදහිත්වා විසිබෙන්ති යනුද; සතු වර පැතවූ සිඛ පිඩුකොට දක්වනු කැමතිව පාරාජිකානි චත්තාරි යනාදී යුහු; ඒ උක්තානුසාරයෙන් දතයුතු. යං තං, යම් භෙදයක්; අපුච්ඡිම්හ, විචාළමෝද; තං තං, ඒ ඒ භෙදය; නො, අපට; අකිත්තයි, කීයෙහි; ව්‍යාකතං, විසඳනලද; අනඤ්ඤථා, ඒ අත්පරිද්දකින් නොවෙයි; එසේමය; තං, නොප; අඤ්ඤං පුච්ඡාමි, අනිකක් විචාරමි; තං, ඒ; ඉංඝ, එබැවින්; බ්‍රෑහි, කිය; විපත්තියො ච, විපත්තින්ගේ භෙදයෝද යන මොහු; වාක්‍යං, වචනය; එකතිංසා යෙ ගරුකා, සාධාරණ අසාධාරණ පාරාජිකාය මහණුන්ගේ සඟවෙසෙස්ය මෙහෙණින්ගේ අසාධාරණ සඟවෙසෙස්යයි ගරුකවූ යම් එක්තිස් දෙනෙක් ඇද්ද; එත්ථ, මෙහි; අනවසෙසා අට්ඨ, පාරාජිකාවෝ අට දෙනෙකි.

## 198 වෙනි පිටේ:-

හස්සාධිප්පායො, සෙනු අභිප්‍රාය ඇතිව; යොච අක්කොසති, යම් ආක්‍රොෂකිරීමෙක් ඇද්ද; අයං දුබ්භාසිතං, යනු සම්බන්ධයි. අසද්ධම්මෙහි පුරක්ඛතා, අසද්ධර්මයන් පෙරදැරිකොට ඇත්තාවූ; දුප්පඤ්ඤා, නුවණ නැත්තාවූ; මොහපාරුතා, මොහයෙන් වළදනා ලද්දෑහු; සම්බුධං, සජීදෙයාට; අබ්භාචික්ඛන්ති, අබ්භාඛ්‍යානය කෙරෙද්ද; විපරීතදිඨිං, මිථ්‍යාදෘෂ්ටිය; ගණ්හන්ති, ගණිද්ද; සා, හෝ; දිඨිවිපත්තිසම්මතා, දෘෂ්ටිවිපත්තියයි සලකණලදුව; ඡ ඡෙදන

කානි, පමාණාතික්කන්තං මඤ්චපීඨං නිසීදනං කණ්ඩුපටිච්ඡාදිං වස්සිකසාටිකං සුගත චීවරප්පමාණං චීවරං භික්ඛුනීනං මුඛසාටිකානි ඡ; උදාලනකං, පැළිම; චත්තාරි අනඤ්ඤපාචිත්තියානි, ඡනං පුබ්බු පගතං භික්ඛුං; යනුද, එහාවුසෝ ගාමාවා, යනුද, සංවිච්ච කුක්කුච්චං යනුද; භණ්ඩනකජාතානං යනුද, යන සතරයි. චතසෙසා භික්ඛු සම්මුතියො, එකරත්තම්පි චෙ-පෙ-අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය අඤ්ඤත්‍ර ඡා රත්තපරමං තෙන භික්ඛුනා භික්ඛුස්ස දුබ්බලං ආපත්තිං අනුපසම්පන්නස්ස, යනුද සතරයි; සතුහුසාමිචියෙ, සො ච භික්ඛු අනභිහිතො-මාචොසකං විනස්සාති-යාව ඡෙදනාය ධාරෙතබ්බො—චත්තිපත්තපූරෙ—පෙ—සංවිභජිතබ්බං—සික්ඛමානෙන භික්ඛවෙ භික්ඛුනා අඤ්ඤාතබ්බං—රතනංවා —පෙ—සො හරිස්සති භික්ඛුනියා වා ගාරයහං අයං තත්ථ සාමීචි; චුද්දසපරමානි, දසාහපරමං අතිරෙක චීවරං—ඌනස්ස පාරිපූරියා මාසපරමං—සත්තරැත්තරපරමං—ඡක්ඛත්තුපරමං—ඡබ්බස්සපරමං සන්ථතං—දසාහපරමං අතිරෙක පත්තො=එළකලොමානි තියොජන පරමං—තෙලානි සත්තාහපරමං—සන්නිධිකාරකං ඡාරත්තපරමං—තෙන චීවරෙන චතුක්කංසපරමං—අඩ්ඪතෙය්‍යකංසපරමං වංගුල පබ්බපරමං—අඞ්ගුලපරමං—මංචපීඨං අංගුලපරමං දන්තකඨානි චුද්දස; සොළස ඡානනානි, (ඒ සොළොස් සිඛ අටුවායෙහි දැක්වූ යේයි) සතං තිංසා ච, එක්සිය තිසක්ද; සතං සත්තති ඉචෙච්ච, එක් සිය සැත්තෑ සිඛයෙක්; සතං සත්තති චත්තාරි, එක්සිය සුසැත්තෑ වෙක්;

## 199 වෙනි පිටේ:-

සතං සඞ්ඝෙච්ච බුද්දකානි, සුඩපාචිත්තියා පත්‍රිහු එක්සියසැටක් පාරාජිකානි චත්තාරි, මේ මෙහෙණුන් සතර පරිජිය; සංඝමහා දස නිස්සරෙ, භික්ෂූන්ට අසාධාරණවූ උත්ටම ආවෙනිකවූ සංඝාදිසෙස දසය; නිස්සග්ගියානි වාදස, භික්ෂූන් හා අසාධාරණවූ නිසගි දෙළ සය; උභින්නං අසාධාරණා, ඔවුනොවූන්ට අසාධාරණවූ මෙහෙණුන්ගේ සතර පරිජිය ඒ භික්ෂුණීන්ට අසාධාරණය; සංඝාදිසෙසාන් භවන්ති සොළස; සුක්විසටිය-ඔතින්න සංඝාදිසෙස තුනය—කුටිකාර සිඛපද දෙකයයි මේ සසිඛය භික්ෂුණීන්ට අසාධාරණය—භික්ෂුණීන්ගේ සඟවසෙස් දසය භික්ෂූන්ට අසාධාරණයයි මෙසේ අසාධාරණ සොළසයි; අනියතානි වෙ, භික්ෂුණීන්ට අසාධාරණවූ භික්ෂූන්ටම පැනවූ අනියතයෝ දෙදෙනයි; නිස්සග්ගියානි චතුවීසති මහණුන්ට අසාධාරණවූ මෙහෙණුන්ගේ දෙළොස් නිසගියි; මෙහෙණුන්ට අසාධාරණවූ මහණුන්ගේ දෙළොස් නිසගියි යන සූවිස්සයි; සතං අඨාරසංචෙව බුද්දකානි, පාචිත්තියයෝ එක්සිය අට

ලොසෙක් වෙත්; එහි ලසුණවග්ග, අන්ධකාරවග්ග, තුවට්ටවග්ග, චිත්තාගාරවග්ග, ආරාමවග්ග, ගබ්භිනීවග්ග, කුමාරිභූතවග්ග, ඡත්ත වග්ග යන මේ නවවග සඞ්ඛ්‍යානු සිඛපද භික්ෂූන්ට ආසාධාරණයෝය, භික්ෂූන්ගෙන් ඔවාදවග්ගද, දෙසිය සිඛපද කෙණෙක් මෙහෙණුන්ට අසාධාරණයෝයි. මෙසේ එක්කොට එක්සිය අටලොසෙක් වෙත්. මහණුන්ගේ පාටිදෙසනීය සතරත් මෙහෙණුන්ගේ අටත් අසාධාර ණත්වය මෙසේමැයි; උභින්නං සමසික්ඛතා, උභයපක්ෂයට සාධාරණ සිඛපදකෙණෙක් ඇද්ද; චත්තාරි, මෛථුනපාරාජිකාදී සතරය; සත්ත සංඝාදිසෙසානිච, සංචරිත්ත, සංඝභෙදක, භෙදානුවත්තක, අමූල අඤ්ඤභාගිය, දුබ්බච කුලදූසක වසයෙන් සත්දෙනය; නිස්සග්ගියානි අඨාරස, නිසගි සික දෙලොසක් හැර උභය සාධාරණවූ උභය විභංගයෙහි ලැබෙන අටළොස්දෙනය; සමසත්තතිඛුද්දකා, මුසාවාද වග්ග, භූතවග්ග, භොජනවග්ග, චරිත්තවග්ග, ජොතිවග්ග, ධම්මික වග්ග යන සත්වග පැනවූ සැත්තෑ පාචිත්තියාපත්තිහුද; දූරසඳ, නොපෑම්ණියහැක්කාවූ; සෙවියන්ගේ මුල් නැසීම කරණ හෙයින් නොසෙවිය හැක්කාවූ; තාලවත්‍ථුසමූපමා, තාලවස්තුව උපමාකොට ඇති; තල උදුරා සිටිතැන බිම්හෙළ කල්හි නැවත නොනැගේද ඒ උපමාකොට ඇති පාරාජිකාපත්තීහු; අඨෙව, අටදෙනෙක්ම වෙත්; යෙ, යම්කෙනෙක් ඒට අවත්නු නම්; තෙ, ඔහු; පණ්ඩුපලාසො, විලික්ස හුනු පතක් මෙන්; පුථුසිලා, පැලූනු ගලක් මෙන්; සීසච්ඡින්නොව යො නරෙ, හිස්සුන් පුරුෂයායම්සේද එමෙන්ද; තාලොව මත්‍ථකච්ඡින්නො, මතසුන් තලක් මෙන්ද; අවිරුල්හී භවන්ති, නොඅටගත්තෝ වෙත්; අඨාසීතිසතං පාචිත්තියා, මහණුන්ගේ දෙයානුවය, මෙහෙණුන්ගේ සයානුවයයි එක්සිය අටඅසූවෙකි.

## 200–201 වෙනි පිටුවල.

(200) අනඤ්ඤත්ථා, අත්පරිද්දෙකින් නොවෙත්; යථාකථං, චූපරිද්දෙන්; සධම්මා, සධම්මයෙන්; චුතො, සැවෙද්ද; පරතො, පැරදේද; හතො, ඒ ස්ථානයෙන් පිරිහිනිද; නිරාකතො, ඔහු විසින් දුරු කරණලදද; තහිං, ඔහු කෙරෙහි; තෙන, එහෙයින්; ඉතිඑතං, මේ ආපත්තිය; ඉතිවුච්චති, පාරාජිකායයි කියනුලැබේ; පදං, මේ සිඛ පදය; අනියතො, අනියතොයයිසේයි; නනියතො, නියතනැත්තේද; අනෙකංසිකතං, නොසනිටුහන් කරණලදද; තිණ්ණමඤ්ඤතරං ඨානං, පරිජ් සඟවෙසෙස් පචිති යන.තුන් කාරණයෙන් එක් කාර ණයකින් (ඇවතක්) වේද; අනියතොති පවුච්චති, මේ අනියතයයි කියනුලැබේ; අවවයො, අපරාධයෙක්; එකකසෙසව, එකක්හටම; එක්කො, එකෙක්; යං නිස්සජිත්වාන; යම්වස්තුවක් නිසඳ; දෙසෙති

ආපත්තිය දෙසාද; කුසලං ධම්මං, කුසල චිත්තය; පාතෙති, හෙළාද; අරියමග්ගම්පරජ්ඣති, ආය්‍යමාර්ගය වරදද; චිත්තසම්මොහනඨානං, චිත්තයාගේ මූලාකරණතැන්වීද; මූලාකිරීමට කරුණුවිද; ඉති වුච්චති, පාචිත්තියාපත්තියයි කියනුලැබේ; අඤ්ඤාතකො සනෙතා, නොනෑවූයේ; කිච්ඡාලද්ධාය; දුකසේ ලද තැනැත්තියගේ; සාමං, තෙමේම; ජහුය, රුචියෙන්; වොසාසති, ඉධ ඔදනං දෙථ යනාදීන් අනුශාසනාකෙරේද; අනිවාරෙන්තා, "අපසක්ක තාව භගිනි" යනාදින් නොවලකා; භුං භුඤ්ජෙ, ඒ විධානකල භොජන වැලඳීනම්; අප්පභොගං, සැපත් නැති; අනාල්හිකං, නැළියකට වී නැති හෙවත් දිළිඳුවූ; සඩා චිත්තං, සැදැසිතැති; කුලං, සෙඛ කුලයට;

(201) සාසංකො, ආසංකා සහිත; සභයානකො, ප්‍රතිභයසහිත; අවිදිතං, පල නොදක්වනලද; පරෙසං, අනුන්ගේ; මමායිතං, මමත්වය කරණලද; ගාරය්‍යාපපත්තා, ගිහිවට පැමිණි; අපරඩං, නපුරුකොට කරණලදද නොහොත් වරදවා කරණලදද; බලිතං, පැකිලීම්වීද; ආවිවා, පැනීද නොහොත්; රහො, නොපැනීද; පවෙදෙනති, කියද්ද; දුබ්භාසිතනති, දුබ්භාසිතයයිසේයි; යං, යමක්; දුරුහඬං, නපුරුකොට කියනලදද; සංකිලිඬං ච යං පදං, යම් පදයක් සකිලුටුද; යං ච විඤ්ඤු ගරහනති, යම් වචනයක් විඥයෝ ගරහද්ද; උජුමග්ගානුසාරිනො, සෘජුමග අනුව හැසිරෙමින්; සික්ඛමානස්ස සෙක්ඛස්ස, හික්මෙන්නාවූ ශෛක්‍ෂ්‍යයාට; එතං, මේ; ආදිච, පලමුන් වීද; චරණං ච, කකුලුත්වීද; මූඛං, දොරවීද; සංයම, සංසිඳීම්වීද; සික්ඛා එතාදිසී නත්ථි, මෙබඳු සිඛපදයෙක් නැති; ජනනමතිවස්සති, සොයනලද්දේ තෙමෙයි; විවටං, විවදනලද්දේ; නාතිවස්සති, නොතෙමෙයි; තස්මා, එහෙයින්; ඡන්නං විවරෙථ, සොයනලද්ද විදව; එවං, එසේකල්හි; නාතිවස්සති; මිගානං, මුවන්ට; පවනං, වනයගහලය; ගති, වහල; ආකාසො පක්ඛිනංගති, අහස පක්‍ෂීන්ට වහල; ධම්මානං, සියලු සංඛත ධර්මයන්ගේ; විභවො, විනාසය; ගති, වහල; නිබ්බානං නිරුපධිශෙෂ නිර්‍වාණධාතුව; අරහතොගති; රහත්හට වහලි; සාසනා'නුග්ගහාය, සස්නට අනුග්‍රහ පිණිස; ගාථාසංගනිකං ඉදං, මේ ගාථා සංගනිකය කියනලදී.

ගාථාසංගනිකාය හා නසසුදදනයයි.

---

මේ සුළුවග (ගැටපදයෙහි) විස්තර හෙයින් කීයේයි.

---

## 202-203-204-206-207-208-209-210 වෙනි පිටුවල:-

(202) කතිඋක්කොටා, ඉගිලීම්හු කෙතෙක් දෙනද; වැලකීම්හු උක්කොට නම්; පසවති, උක්කොටනය වේද; දුක්කතං, නපුරුකොට කරණලද; අනිහිතං, නොසන්හුන්නේය; පුනනිහිතබ්බං, නැවත සන්හිඳිවියයුතුය; අවිනිච්ඡිතං, විනිශ්චය නොකරණලද; අවූපසන්තං, වැපසමනයට ගියේ නොවෙයි; තත්‍ර ජාතකං, ඒ වෙහෙරවූ; තත්‍ර ජාතං වූපසන්තං, ඒ වෙහෙර ඉපද සන්හුන්; තත්‍ර ගතං, එකමතැනට ගිය; (203) තදහු උපසම්පන්නෙනා, එදවස් මහලු පැවිදි වූයේ; කාරකො, කර්මය කෙළේයි; කින්නිදානං, කුමක් මුල්කොට ඇත්තේද; කිං සමුදයං, උපත් කවරේද; කිංජාතිකං, කුමකින් වේද; කිංපභවං, කවරක් ප්‍රභවකොට ඇත්තේද; කිංසම්භාරං, කවරක් රැස්කොට පිරිවරකොට ඇත්තේද; කිංසමුට්ඨානං, කවරක් සමුට්ඨාන කොට ඇත්තේද; හෙතුං නිදානං, හෙතුව කුශලාකුශල අව්‍යාකෘත වශයෙන් නව හෙතූන් මුල්කොට ඇත්තේයි; පච්චය නිදානං, පස හෙතු නිදානයකොට ඇත්තේය; (204) වාදස මූලානි, කොධනො හොති උපනාහි, මක්ඛිහොති පලාසී, ඉස්සුකීහොති මච්ඡරී, සඨො හොති මායාවී, පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨි, ආධානගාහී හොති දුප්පටිනිස්සග්ගී යන සයය ලොභාදී තුනය අලොභාදී තුනයයි මෙසේ ආධ්‍යාත්මිකවූ දෙළසයි; චුද්දස මූලානි, ඔහු ආධ්‍යාත්මික දෙලොස්දෙනම කාය වාචාවන් හා සමග තුදුසෙක් වෙත්; ඡමූලානි, කායාදි සමුට්ඨාන සයයි; අට්ඨාරස භෙදකරවත්ථූනීති, අධම්මො ධම්මොත්‍යාදීනි; චතස්සො විපත්තියො, සීල විපත්ත්‍යාදිහුයි; ආපත්ති අනාපත්ති, ආපත්ති අනාපත්තිද; ආම, එසේමැයි; ඔමසති, ජාත්‍යාදීන් සවා බෙණේද; කතිසු ඨානෙසු, කෙතෙක් තැනද; (206) කතමම්හි ඨානෙ, කිසිතැනකත්; (207) යථා කථං විය, හෝ කෙසේද; (208) යත්‍ර, යමෙක්හි; (209) සංසට්ඨා, මුසුහුද; විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා, වෙන්වෙන්කොට; නානාකරණං පඤ්ඤපෙතුං, නානත්වය දක්වන්නට; ලබ්භාව පන, හැකිද; (210) ඡන්නංසමුට්ඨානා, සමුට්ඨාන සම්මුඛා විනය හැර අන්සමයෙහි එකෙක, එකෙකම; සමුට්ඨාන සයක් සයක් ලැබෙන බැවින් සමුට්ඨාන සතිසෙක් වි; සති විනයස්ස, සතිවිනය කර්මයාගේ ක්‍රියා ඤත්තිවීම; උපගමනං, කර්ම කරන්නට තමා යාම; අජ්ඣුපගමනං, මේ කර්මය නොකරයි අනුන්ට ඇණවීම; අප්පටිකොසනා, නොපිළිබැගීම;

## 211-212 වෙනි පිටුවල:-

(211) නානට්ඨා, නන් අර්ථ ඇත්තෝද; නානා බ්‍යඤ්ජනා, නන් බ්‍යඤ්ජන ඇත්තෝද; උදාහු, නොහොත්; එකට්ඨා, අර්ථයෙන් [illegible];

බ්‍යඤ්ජනමෙවනානං, බ්‍යඤ්ජනයෙන්ම වෙන්වූද; විවාදෙ, විවාදති කරණනති ආදීනි අඪපදනි පුච්ඡාවසෙන වුත්තානි; විපච්චයතාය වොහාරො, ප්‍රතිපක්ෂ බැවින් කීමෙක්; මෙධකං, ඩබරෙක්; අනුවාදො, අනුවදන චොදනාකිරීමෙක් ඇද්ද; (212) අනුල්ලපනා, අනුලපනයකිරීමෙක් ඇද්ද; අනුසම්පවංකතා, එහි තතු බවෙක් ඇද්ද; අබ්භුස්සහනතා, උපසත්ථම්භබවෙක් ඇද්ද; අනුබලප්පදනං, බලදීමෙක් ඇද්ද; සොතාපත්ති සමාපත්ති දෙකෙහිත් ආපත්ති නාමය ලැබෙයි එතකුදුළුව ඒ අධිකරණ නොවෙ. මෙහි සියාවාරයන් විසඳුයේ නැත. විවාදෙ අධිකරණංයි මූල පදය දක්වා නිද්දේශයෙහි තප් කතමං අධිකරණං චෙව විවාදො ච විවාදො අධිකරණං චෙව විවාදො ච"යි දක්වූයේයි. එසේ ලෙසට සියාවාරයට මූල තිබූ "විවාදො අධිකරණං" යන පාඨයට "අධිකරණං චෙව විවාදො ච"යි කියයුතු බව යුක්තවන්නේයි.

## අධිකරණභෙද.

---

### 213-214 වෙනි පිටුවල:—

(213) චොදනා කිමත්ථාය, වසතුආපත්ති දක්වා චොදනාකිරීම කුමටය; කිස්සකාරණා, වරද සිහිකරවීම කවරකට කාරණද, මති කම්මපන කිස්ස කාරණා, විනයධරයන්ගේ විනය සංසන්දනය කවර කාරණයකටද; සාරණත්ථාය, චොදනාකළ වරද සිහිකරවනු පිණිසය; සාරණා, සිහිකරවීම; නිග්ගහත්ථාය, නිගන්නා පිණිසය; පරිග්ගහත්ථාය, විනිශ්චයෙහි යහපත නපුර දන්නා පිණිසය; පාටියෙක්කං, සුත්තන්තිකභාණක උභතොවිභඞ්ගභාණක ඛන්ධකභාණක සථවිරයන් වෙන වෙනවෙනම විනිශ්චයකරණ පිණිසයි; සචෙ අනුවිජ්ජකො තුවං, තෝ ඉදින් මෑ උපන් විනිශ්චය සනිටුහන්කරන්නට හුන් විනයධරයෙක් වෙහිනම්; මා ඛො තුරිතො අභණි, වහා නොකිය; චණ්ඩිකතො, නදව; මාඛො පටිඝං ජනයි, වෛරනූපදව; අනත්ථසංහිතං, අවඩින් යුක්තවූ; විග්ගාහිකං, කලහ උපදවන-පිරිස් ඇලලෙන; කථං, තෙපුල; මාඛො සහසා අභණි, වහා නොකිය-ලාහෙලා නොකිය; සුත්තෙන, පරිජිපවිති දෙපොතද; විනයෙ, සුළුවග මහවගද; අනුලොමෙ, පරිවාරයෙහිද; පඤ්ඤත්තෙන, සියලු විනයෙහිද; අනුලොමිකෙ, සූත්‍රය සූත්‍රානුලොමය ආචාර්‍යවාදය අත්තනොමතිය යන සතර මහා අපදෙසයෙහි; සුවුත්තා, මනාකොට වදරණලද; කුසලෙන, සියල්ලෙහි දක්‍ෂවූ; බුද්ධිමතා, ඥනපාරයට පැමිණි බුද්ධිඇති සර්ඥයා විසින්; කතං, කරණලද-හැරතබනලද;

සික්ඛාපදානුලොමිකං, සියලු සිඛපදයන්ට අනුලොම්වූ; අනුයොග වත්තං, විනිශ්චයකරණවූන් විසින් යෙදියයුතු වත; සම්පරායිකං, පරලොවවත්නාවූ; සුගතිං, සුගතිය; නතාසෙනෙන්තා, නොනසමින්; උභො අනුක්ඛිපනෙන්තා, දෙපක්ෂයෙහිතෙපුල් නොනගමින්; පටිඤ්ඤානුසන්ධිතෙනකාරයෙ, තෙපුල් අනුසන්ධියෙන්ද ප්‍රතිඥායෙන්ද කරව; ලජ්ජිසු කතා, ලජ්ජීන් කෙරෙහි කරණලද; බහුම්පි භාසෙය්‍ය, බොහෝකොට කියන්නේය-කීයේවීනම්; වත්තානුසන්ධිතෙන කාරයෙ, වත්තානුසන්ධියෙන් හෙවත් ඔහුගේ වත් හා සමග යම් ප්‍රතිඥාවක් ගැලපේද ඒ ප්‍රතිඥායෙන් කරන්නේය, පසිඳිනේයයිසේයි; යස්ස, යමෙක්හුගේ; පටිඤ්ඤා, ප්‍රතිඥානොමෙ; නරූහති, නොනැගේද; එතං ච, මේද; අහං තං පුච්ඡාමි, මම තා විචාරමි; කිදිසො පුග්ගලො අලජ්ජි වුච්චති, කෙබඳු පුගුලෙක් අලජ්ජියයි කියනුලැබේද; පරිග්ගුහති, සඟවාද-නොදෙසාද-නොනැගේද; අගති ගමනං ච ගච්ඡති, ඡන්දදිඅගතිගමනයන්කෙරේද; සච්චං, සැබවි; අකාලෙන, නොකල-නොඇණවූසඳයයිසේයි; අභූතෙන, නැහිදෙයින්; ඵරුසෙන, තදින් අනත්ථසංහිතෙන, අවඩින් නිශ්‍රිත වචනයෙන් (චොදනාකෙරේද;) දෙසන්නාරෙ, වෙෂ සිතැතියාව;

(214) කාලෙන, කියයි කිකල්හි; සණ්හෙන, සිලුටුවූ; පුබ්බාපරං, පළමු පසු කියයුතු කථාව; අකොවිදෙ, ඒ දූන්මෙහි අදක්ෂද; අනුසන්ධි වචනපථං, කථානුසන්ධි විනිශ්චයානුසන්ධි (නොදනීද); චොදනා කිනතිවුච්චති, චොදනා කවරකාරණයකින් කියනුලැබේද; සීලවිපත්තියා, පරිජි සඟවෙසෙස් දෙකින්දින්; දිට්ඨියා, අන්තගාහික දෘෂ්ටියෙන්-මිථ්‍යාදෘෂ්ටියෙන්; ආජීවෙනපි, ආජීවකාරණවූ ඇවත් සයින් හෝ සිඛපද සයින් මෙයින් අන්‍යය ආචාර විපත්තියි.

අපර ගාථා සංගනිකං.

---

## 215-216-217 වෙනි පිටුවල:—

(215) අනුවිජ්ජකෙන, පිළිසඳ විනයධරයා විසින්; යං, යම් කාරණයකින්; තං, ඔහු; කිමසි, කවර ඇවතෙක; ජානාසි, දනීද; තෙ, තා විසින්; කිං දිට්ඨං, කුමක් දක්නාලද්ද; කිනති, කුමක; කදා, කවර කලෙක; කත්ථ, කොතනක; අජ්ඣාපජ්ජනෙන්තා, අවදනේද; කත්ථච ත්වං අභොසි, තෝ කොතනකවීද; රුජ්ජනං, රජුන් කෙරෙන් අසනලද්ද; පරිසංකාය, සැකයෙන්; [216) දිට්ඨං, දුටුවා; දිට්ඨෙන; දුටුවා හා; සමෙහි, සමවේද-එක්වේද; දිට්ඨං දිට්ඨෙන සංසන්දතෙ,

හැඟේද; දිඨං පටිච්ච, ඔහු දුටු දෑක්මනිසා; න උපෙති, ඉතරයා පාරා ජිකාවට අවතිම්සි යන ප්‍රතිඥව නොකෙරේද; (සො පුග්ගලො) අසුද්ධ පරිසංකිතො, මුල්නැතිව සැකකරණලද්දේය; තෙන, ඔහු හා; උපොසථො, උපොසථාදිය; පටිඤ්ඤාය කාතබ්බො, මම නොකෙළෙමියි යන ලජ්ජාහුගේ ප්‍රතිඥයෙන් කටයුතු; මුතං, ගන්ධරස ස්පෘෂ්ට වූයය.

## අනුවිජ්ජ කථා.

---

ඔකාසකම්මං, අවසරකිරීම; (217) යෙන ධම්මෙන යමෙන, යම භූත යම් වස්තුවකින්; යෙන විනයෙන, යම් චොදනා සාරණාවකින්; යෙන සත්ථුසාසනෙන, යම් ඥත්තිසම්පද අනුසාවණ සම්පදාවෙකින්; සාමග්ගත්ථාය, සමග්ගිව පිණිසය; පරිභාසති, අවඥකෙරේද; බලො, කණනාලද කුසල්මුල් ඇති; උපහතින්ද්‍රියො, නසනලද ශ්‍රද්ධාදි ඉඳුරන් ඇති; නව සික්ඛාය ගාරවො, ශික්ෂාම්වහිද ගෞරව නැති; දුම්මෙධො, නුවණනැත්තේ; නිරයං ගච්ඡති, නිරාවදනේයි. නවාමිසං නිස්සාය, චීවරාදි ආමිසත් නොනිසා; නව නිස්සාය පුග්ගලං, පුද්ගලයාත් නොනිසා; උභො එතෙ විවජ්ජෙත්වා, උන් දෙන්නම හැර-අපෙක්ෂා නොකොට නොතකා; යථාධම්මො, ධර්මය යම්ලෙසක සිටියේද; තථා කාරෙය, එලෙසකරන්නේයි; පරිභාසකො, පරිභව බෙණේද; උපෙති, නගාද; තාදිසො චොදකො, එබඳු චොදන්නෙක්; අත්තානං ඛාපෙති, තමාදවයි; උපකණ්ණකං ජප්පෙති, කන්මුලට බෙණේද—නොදුරුද; ජිම්හං පෙක්ඛති, වරදම සොයාද; වීතිහරති, විනිශ්චය පිරිහෙලාද; කුම්මග්ගං සෙවති, නොමග සෙව්ද- නිවර දෙහි වරද දක්ද; ධම්මාධම්මං, ධර්ම අධර්ම දෙක;

## චොදනා කණ්ඩං.

---

## 219-220 වෙනි පිටුවල.

219–සංගාමාවචරෙන භික්ඛුනා, ප්‍රතිපක්ෂාර්ථී ඇත්තවුන් ගෙණ විනිශ්චය කරණ පිහිටුවන මහණුන් විසින්; නීචචිත්තෙන, යටත් සිතැත්තහු විසින්; රජොහරණ සමෙන චිත්තෙන, පාපිස්නිය වැනි සිතින්; අනුපඛජ්ජන්තෙන, නොසටන්නහු විසින්; යථා පති රූපෙ ආසනෙ, තමාහට පත් අස්න නොසික්ම; නානා කපිකෙන, නන් කථා ඇත්තහු විසින්; තිරච්ඡාන කපිකෙන, සගමොකට අවුල් කථා ඇත්තහු විසින්; අජ්ඣෙසිතබ්බො, නියොග කටයුත්තේය; අරියො වා තුණ්හීභාවො, ආර්යවූ තුෂ්ණීම් භාවය; නාතිමඤ්ඤිතබ්බො

ඉක්ම නොසිතියයුතු—කම්මවහන්ති යෙදී හිත්දයුතු; සංඝෙන අනුම තෙන අනුවිජ්ජිතුකාමෙන පුග්ගලෙන ති පදසම්බන්ධමෙව්; අත්‍ර, එහි; අත්තවසිකෙන; අත්තවසයට පැමිණියහු විසින්; නො පරිසපරිකප්පිකෙනාපි, පිරිස් අනුව කියන්නහු විසින් නොවිසිය යුතු; උපකණ්ණජප්පිනා, කණට කොඳුරන්නහු විසින්; ජිම්හං, වරද; න අක්ඛීනි ඛනිතබ්බානි, ඇසිහු නොකැණිය යුත්තෝයි—ඇසින් තර නොලිය යුතු; භමුවිකාරෙ න කාතබ්බො, කියයුතුද නොකියයුතුද දන්නා පිණිස භෘනවිකාර නොදක්විය යුතු; එම කියත් :- න හත්‍ථමුද්‍දා දස්සෙතබ්බාති—අත්‍ථං අනුවිධියන්තෙන, විනිශ්චය පිළිවිදිනහු විසින්—පරීක්ෂා කරන්නහු විසින්; හිතපරිසක්කිනා, හිතවිමෙසි සමාචියා විසින්; අසම්ඵප්පලාපිනා, හිස්තෙපුල් නොකියන්නහු විසින්; පරියන්තභාණිනා, කථා කෙළවර දැන දෙඩන්නහු විසින්-බොහෝ කොට නොදොඩන්නහු විසින්; අවෙර වසිකෙන, ක්‍රොධ වසඟ නොවන්නහු විසින්; අනසුරුත්තෙන, නොමනා නපුරු තෙපුල් ඇත්තහු විසින්; නහවිතබ්බං, නොවිය යුතු; අත්තාපරිග්ගහෙතබ්බො, තමා විනිශ්චයෙහි පොහොසත් නොපොහොසත් බව පරීක්ෂාකොට දතයුතු; පරොපරිග්ගහෙතබ්බො, මේ පමින් ලජ්ජීදෝ අලජ්ජීදෝ මාවිසින් සංහිඳිවිය හැකිදෝ නොහැකිදෝයි දතයුතු. (220) අහාපෙන්තෙන, නොපිරිහෙලන්නහු විසින්; අප්පකාසෙන්තෙන, නොහඟවන්නහු විසින්; ඔතිණ්ණානි, බටුවාවූ—කී කී; පදබ්‍යඤ්ජනානි, පදයත් හා ව්‍යඤ්ජනයත්; සාධුකං, මනාකොට; උග්ගහෙත්වා, උගෙණ—සිත තබාගෙණ; යථා පටිඤ්ඤාය, ප්‍රතිඥාවූ පරිද්දෙන්; චොදකොපකාසෙතබ්බො, * බොලදයා ඝොහයන් මුළා තැනැත්තේ තියුණු කාවයුත්තේයි—සිහිනුරවාගතයුතුයි; භීරූ, බනසුල්ලා; චණ්ඩො, කොධුස්සන්නනාශා; නිසෙධෙතබ්බො, වැළකියයුතුයි—තැජියයුතුයි; අසුචි, අලජ්ජිතෙම; විභාවෙතබ්බො, ප්‍රකාශකටයුතුවේ—ඇවැත්දෙස්විය යුත්තේය; උජු, යම් මහණෙක් සිල්වත්ද කායවංකාදිය නැත්තේද ඒ මහණ; මද්දවෙන, මොළොකින් විචාලයුත්තේයි; ගරුං, ගරුද වෙයි; භාවනීයො ච, මනා සම්භාවනය කටයුතුද වෙයි; සුත්තං, අනුවිජ්ජකයා විසින් එළවන ලද සූත්‍රය; සංසන්දනත්‍ථාය, ආපත්තානාපත්ති සංසන්දනය පිණිස; පටිබොධනත්‍ථාය † වැළකීම පිණිසයි; ඨානාඨානගමනත්‍ථාය, ලහුක ගරුක ඇවැත් දන්නා පිණිසය; දුම්මඞ්කූනං, අලජ්ජීන්ගේ; සම්පග්ගහණත්‍ථාය, නැගීම පිණිසය; ‡ සම්පරිග්ගහං සම්පටිච්ඡ

---

* මනෙඤාසෙතබ්බො, පාලි. † සම්පහණත්‍ථාය තැස්මපිණිසයි

‡ පාලිබොධනත්‍ථාය—පාලි.

තත්ථාය; මොනවට විනිශ්චය ගන්නා පිණිසය; සුවිනිශ්චිත දුර්විනිශ්චිත භාවය දන්නා පිණිසද වේ; පවෙචකථාභිනො, සංඝයා විසින් පරීක්ෂාකොට ජ්‍යෙෂ්ඨස්ථානයෙහි තැබුවාහුද; අවිසංපදඨායිනො, පිළිබැඟිය යුතුතැන තුබුවාහුද නොසෙවිය යුතු; * විනයො, විනය කුමටදැයි සිතත හොත්; සංවරත්ථාය, කායවාග්වාරයන්ගේ වැසීම පිණිසය; සංවරො, සියලු සංවරය; අවිප්පටිසාරත්ථාය, චිත්තයාගේ අවිප්පටිසාරය පිණිසය; පාමුජ්ජත්ථාය, තරුණ ප්‍රීතිය පිණිසය; පීතත්ථාය, මුහුකුළ ප්‍රීතිය පිණිසය; පස්සද්ධත්ථාය; කාය චිත්ත දරථයන්ගේ සංසිඳවීම පිණිසය; සුඛත්ථාය; කායික චෛතසික සුඛය පිණිසය; සමාධත්ථාය, ලෞකික ලොකොත්තර සමාධිවූ චිත්තෛකාග්‍රතාව පිණිසය; යථාභූතඤාණදස්සනත්ථාය, පස්කද අනුණුදන්නා උදයව්‍යය ඥාණය පිණිසය. හෙවත් තරුණ විපස්සනාවූ උදයව්‍යයඥානය පිණිසය; නිබ්බිදත්ථාය, නිබ්බිදානුපස්සනා ඥාණය පිණිසය; හෙවත් මුදුන් පැමිණි බලවත් වුඨානගාමිනී විදර්ශනාව පිණිසය; විරාගත්ථාය; සතරමාර්ගය පිණිසය—මෙතන පළමුමග ගතයුතු; විමුත්තත්ථාය, ඵලය පිණිසය; විමුත්තිඤාණදස්සනත්ථාය; ප්‍රත්‍යවෙක්ෂාඥානය පිණිසය එකක් එකක්හට මාර්ගඵල නිර්වාණ ප්‍රහීණක්ලේශ ශෙෂක්ලේශයන්ගේ වශයෙන් පසෙක්වෙයි රහතන්ට ශෙෂක්ලේශ ප්‍රත්‍යවෙක්ෂා නැතිහෙයින් ප්‍රත්‍යවෙක්ෂාවෝ එකුන්විස්සෙක් වෙත්; අනුපාදාපරිනිබ්බානත්ථාය, පසනැතිව පිරිනිවීම පිණිසය; යදිදං, යම් මේ; අනුපාදාය, උපාදානයන් විසින් නොගෙණ; චිත්තස්ස, අභින්ඵල චිත්තයාගේ; විමොක්ඛො, මිදීමෙක් ඇද්ද හේ; එතදත්ථා කථා, විනය කථාව මේ පිණිසය; මන්තනා, විනය සංසන්දනයද; උපනිසා අයං විනයො සංවරත්ථාය යනාදීවූ පරම්පරා ප්‍රත්‍යය ක්‍රමයෙන් පසවීද; සොතාවධානං, කන් යොමු කිරීම—මේ පරම්පරප්‍රත්‍යය කථාවට කණතතු කිරීම-ඒ ඇසීමෙන් උපන් නුවණද; නිදානං, සැටැන් ආදියයි; ආකාර, කරණු නොකරණු; සචෙත, නුවණින් කමමංච, කම්යද; රතෙතා, ඇලුනේ; දුසෙඨා දූෂිතවූයේ; මූළ්හො, මූළාවූයේ; භයා, භයින්ද; සම්මොහා, මොහයෙන්ද; ගච්ඡති, අගතියට යෙයි; නවසඤ්ඤත්තිකුසලො, † අන් දූත්මෙහි අදක්ෂද; නිජ්ඣත්තියාව; තෙමේ කාරණා කාරණා දූත්මෙහි; අකොවිදෙ, අදක්ෂද; ලද්ධපක්ඛො, තමාගේපිරිස්බඳු පිරිස් ලදුයේ හෝ තමාසේම ලදපිරිස් ඇත්තේද; අහිරිකො, නිහිකද; කණ්හධම්මො, ‡ නපුරු ලාමක කර්මාන්ත ඇත්තේද; අප්පතිකො,

---

* නොගැටිය යුතු, සමහරපිටපොත්හි † පඤ්ඤත්ති.—පාළි

‡ කණ්හකම්මො

නොබැලිය යුත්තේය—ජ්‍යෙෂ්ඨස්ථානයෙහි නොතැබිය යුත්තේයි; (221) සමෙන, නුවණින්; හිරීමනො, ආධ්‍යාත්මිකවූ හිරියෙන් හා බාහ්‍යවූ ඔත්තප්පයෙන් යුක්තද; .

## චූළසඞ්ගාමො.

---

### 222-223-224-225-227-228-230 වෙනි පිටුවල.

222—සංගාමාවචරෙන, විනයධර; පෙක්ඛිතියෙ ඨානෙ, බැල් වියයුතු තන්හි; නොහොත් බැලියයුතුතන්හි; පෙක්ඛිතබ්බං, බැල්වියයුතු; පෙක්ඛිතබ්බං වා—නබ්‍යාහරිතබ්බං, නොකියයුතු; ආකාරතො, ඔම් මේ අධිකරණය සංහිඳුවන්ට පොහොසද්දැයි යනාදි ආකාරයෙන්; (223) පංචසු ධම්මෙසු, කාලෙන වක්ඛාමි යනාදි; සංකමති, ඉන් ඊට ගෙනයේද; අවජානිත්වා, දූත; පටිජානාති, වළහාද; අඤ්ඤෙන, අන්කාරණයකින්; අඤ්ඤංපරිචරති, සඟවාද; වයංවය සමාපත්ති, දෙන්නෙකුගේ එක්වීම; වණ්ණාඅවණ්ණා, නීලාදි වර්ණවිසින්ද ආරොග්‍යාදි වර්ණවිසින්ද—මෙයින් සුක්විසට් සඞ්ඝාදිසෙස් කීහ; ධම්මනුපපදති, * දන්දීම්; මෙයින් සච්චරිත්‍ර † කීහ—සොළස කම්මානි,චත්තාරි අපලොකනකම්මානි යනාදීන් එහිම දක්වූ චතුෂ්ක සතරයි; චත්තාරි අපලොකනකම්මානි, අධම්මෙන වග්ගකම්මං සමග්ග කම්මං, යන මෙයින් චතුත්ථමෙව අනුඤ්ඤාතං (224) බහුජන අහිතාය, බොහෝදෙනාට අවැඩපිණිස; ඛතං, කණනලද කුසල්මුල් ඇතිව; උපහතං, නසනලද; සාවජ්ජාවහොති, සාපරාධවෙයි; විඤ්ඤූනං, විඥයන් විසින්; සානුවජ්ජාව, චොදනා කටයුතුද වෙයි; අනත්ථං මෙ අචරිනි, මට අවැඩ කෙළේයයි; ආඝාතං බන්ධති, වෛරබඳී; නවහි ආඝාතවත්ථූහි, ආඝාතවස්තූන් නවදෙනා විසින්; ආඝාතිතො, ‡ පහරණ ලද්දේ; පරිඝාතිතො § මොනොවට පහරණලද්දේ; කොධාභිභූතො, කොපින් මඩනාලද්දේය; (225) පරාමට්ඨො, ගන්නාලද්දේය; විසමනිස්සිතො, විෂමවූ කායකර්මාදීන් යුක්තයයි කියාද; ගහණනිස්සිතොවා, මිථ්‍යාදෘෂ්ටිසංඛ්‍යාත ගහන් ඇසිරූ කෙළේයයි වත්; බලවනිස්සිතො, බලඇත්තවුන් ඇසුරු කෙළේයයි වත්; තස්ස භයා භීතො; ඔහු කෙරෙන් භයපත්වූයේ; අතිවත්තානි, ඉක්මපවතීද; තස්ස යසො, ඔහුගේ යසස; කාළපක්ඛෙ චන්දිමාඉව, කෘෂ්ණපක්ෂයෙහි පිරිහෙන චන්ද්‍රයාමෙන්; නිහීයති, පිරිහෙන්නේයි; (227) ආපූරති, පිරෙන්නේයි; සඤ්ඤාපනීයෙ ඨානෙ, හැඟවියයුතු තන්හි;

---

* වචන මිනුපපදතං—පාලි. † සංචරිත්‍රය
‡ ආඝාතො § පරිඝාතො-පාලි.

දීපෙනෙතා, කියන්නේ; නිජ්ඣාපනීයෙඨානෙ, සිහිවියයුතු තන්හි; නිජ්ඣාපෙනෙතා, සිත්වන්නේ-පිරික් සවන්නේ; (228-) නපකඛවා, පක්ෂනැත්තේය; න ඤාතිවා, නෑයින් නැත්තේය; අවජානනෙතා, අවඥකරන්නේයි; රතනඤ්ඤූ, බොහෝ රාත්‍රි දනිමි; (හෙවත්) චිර පබ්බජිතො, පැවිදිවූ බොහෝ කලක් ඇතියෙමි; අපඤ්ඤාතො, අප්‍රසිද්ධ; අප්පකතඤ්ඤූ, විනයඥ නොවෙයි; අකතං භවිස්සතීති, නො කිරීම·යහපත් වන්නේයයි; (230-)කතමා පුච්ඡා, කවරපිලිවිස්මක්ද; අජ්ඣාචාර, ව්‍යතික්‍රම; ඔදාතංවා, එලළුනෝ; ලිංගෙ, වෙශයෙහි; ගවජාතං, යෙම්න්කරන්නහුගේ; ජගතියානි සබ්බානි, පඨවිපෙව චතානිතානි; භූමිං පුච්ඡාමි, බිම්නොබිම් සාමාන්‍යයෙන්විචාරමි;

මහාසංගාමං.

---

## 232-233-234-235-වෙනිපිටුවල:—

(232-) කස්ස, කවරෙකු විසින්; අතථාර්‍ය්කස්සව, ඇතුලත් විසින්ද; ඉමෙසං විනනං පුග්ගලානං, මේ පුගුලන්දෙදෙනා විසින්; කිනති, කෙසෙයින්; උල්ලිඛිතමතෙතන, සන්ගත් පමණකින්; ධොවන මතෙතන, කඩදෙවි පමණකින්; විවරවිවාරණමතෙතන, පස්අතු ආදියට සැහෙයි යනාදීන් විධානකල පමණකින්; ඡේදන මතෙතන, කඩකැපූ පමණකින්; බන්ධන මතෙතන, සැතුලූපමණකින්; ඔවට්ටිකරණමතෙතන, මූල්පැදින් පැදිපමණකින්; කණ්ඩුසකරණ මතෙතන, ඔබාපැදීම් පමණකින්; දළ්හීකම්මකරණමතෙතන, දෙපටකිරීම් පමණකින්; අනුවාත කරණමතෙතන, දිග පටු නුවා කිරීම පමණකින්; පරිභණ්ඩකරණමතෙතන, පුළුල කුසි නුවාලූ පමණකින්; ඔවටෙටය්‍යකරණ, අන්වාපත්ලීම්; කම්බලමද්දනමතෙතන, දලවන්කල පමණකින්; නිම්තනකතෙන, මේ කඩදූන කෝත් මැනව කෙළින් අතුට පියම්යි සලකුණුකල පමණකින්; පරිකථාකතෙන, දූන්නහුට අනුසස් මහතැයි පරිකථාකොට-වට කථා*කොට අතුල පමණකින්; කුක්කුච්චකතෙන, කුකුස්කරණලද් දේශ; තාවකාලිකතෙන, ඇතුළලා නොපට දීලම්යි තව්කැලිකොට ගත්තෙන්; සන්නිධි ාතෙන, කරණසන්නිධි නිචය සන්නිධි වූ යෙන්; නිස්සග්ගියෙන, නිසගිවූයෙන්;- එද දූන්නා දෙවනද අරුණ නැගිසඳ දීමෙන් නිසගිනම් හැරියයුතුවූයේයි දසදවසක් ඉකුත්මිස එක අරුණක් නැගි පමණකින් නිසගි නොවන්නේයි; අකප්පකතෙන, කප්බිඳු නොදූන් සිවුරෙන්; අඤ්ඤාත සංඝාටියා

---

* කවටකථා-සමහර

සඟල හැර.අ තිකෙකින්; අනාදෙය්‍යදනං, * කෙලින් අතුරන්නට සිදු පසිදු නමහටම නුදුන දීමනාවිකැලියයි සේයි; උද්‍රියති, නැගේද; අහතකප්පන, අලුත්කඩවැනිවූ-අලුත්වත්වූ; (233) පංචකෙනවා, පස්අතු ඇති හෝ; තදහෙව, එදවස්ම; සච්ඡින්නෙහත, කැපූ; සමණ්ඩලිකාතත, මැඩිලිකිරීම් ආදියෙන් කොටනිමවූසිවුරෙන්; පණ්ණරස ධම්මා, පසළොස්ධර්මයෝද-කවර පසළොස්ධර්මයෝද? අට්ඨමාතිකා, පක්කමනන්තිකො නිට්ඨානන්තිකො සන්නිට්ඨානන්තිකො නාසනන්තිකො සවණන්තිකො ආසාවච්ඡේදිකො අන්තරුබ්භාරො සහුබ්භාරො යන නම් අට හා ද්වෙ පලිබොධා, ආවාසපලිබොධදෙකය; පංචානිසංසා, අනාමන්තචාරය අසමාදානචාරය ගණභොජනය යාවදත්ථචීවරය යොච තත්ථ චීවරුප්පාදය යන පස හා පසළොසයි; පයොගස්ස, ප්‍රයොග කරන්නාහට-සිවුරු දෙවීම් ආදිවූ ඉදිරි යහි පෙළමදූක්වූ සත්විධවූ පූර්වකරණය කිරී පිණිස දිය එළවීම් ආදි ප්‍රයොගයන්ගේ වී නතමෙ ධම්මා, කෙතෙක් ධර්මයෝ; අනන්තරපච්චයෙන, අනතුරුව පසවීමෙන්; පච්චයො, පුරෙජාතපච්චය යන ... පසවීමෙන්; පබ්බකරණස්ස, සිවුරු දෙවීම් ආදිවූ සත්විධ පූර්වකරණය; පච්චුද්ධාරස්ස, පරණ සඟල ආදි පසදිරීම; අධිට්ඨානස්ස, කැප්‍රින් සිවුර ඉටන්නාහට; අත්ථාරකස්ස, කෙළින් අතුරන්නාහට; පත්තුස්ස, සඟලපොරෝනා අඳනා සංඛ්‍යාත කෙළින්වතට; පුරෙජාතපච්චයෙන; පළමුව පසවීමෙන්—පළමුව උපන්නාහට පසවීමෙන්; පච්ඡාජාතපච්චයෙන, පසුව උපදනාහට පසවීමෙන්; සහජාතපච්චයෙන, නොපසු පෙරටව-එක්ව පසවීමෙන්; පණ්ණරසධම්මා, අට්ඨමාතිකා ද්වෙපලිබොධා පංචානිසංසා (234) ආසාව, ලාභාසාවද-ආලයද; අනාසාව, ආලය නොකිරීමද; වත්ථුස්ස, කෙළින් සිවුරුවතට; (235) හෙතුනිදානො, ඛොමකප්පාසිකාදීවූ සිවුරු මුල්කොට ඇතියේයි: සස්ස උකතාඡීයි. බන්ධෙනන, සතුලිමෙන්;

## 236-237-238-239-240 වෙනි පිටුවල: -

(236-) පුබ්බකරණං, සිවුරුදෙවීම් ඈසතයි; පරංනවිඝඬඬපෙනි, අනුත් නොඅස්වාද; වත්ථුවිපත්තං, ඒ අකැප පිළිවිසින් වස්තු විපත්ත වේද; කාලවිපත්තං, අද දවස් දෙන්නවුන් දූන්නා සෙටදවස් අතුරන්ට දීමෙන් කාලවිපත්තවේද; කරණවිපත්තං, සිවුරු කොට අරුණු නැගීමෙන් කරණවිපත්තවේද; සම්පත්තං, යහපත්වූ; (237) තෙසඣඬුව ධම්මානං, යම් රූපාදි ධර්ම කෙතෙකුත් ඇතිකල්හි කඨින නම්වේද ඒ රූපධර්මයන්ගේ යම් යම්; සංගහො, ගැන්මෙක්;

---

* අහාදිය දන—පාලි.

සමවායෝ, රැසක්; නාමං, නම්පනතෙක්; නාමකම්මං, නම්ක මෙක්-නම්කිරීමෙක්; නාමධෙය්‍යං, නම් දැරීමෙක්; නිරුත්ති, දක්ව දක්වා කීමෙක්; ව්‍යඤ්ජනං, නොයෙක්ලෙසකීමෙක්; අභිලාපො, විශේෂයෙන් කීමෙක් ඇද්ද; ඉදං, මේ; කඨිනං, කඨිනනම්වේ- කඨි නය යන්මේ බොහෝ ධර්මයෙහි නම්පනතෙක, පරමාර්ථයෙහින් එක ධර්ම කෙනෙකුත් නැති, වර්ණගන්ධාදිය හැර කඨිනය යනමේ නම් පමණෙක, නාම ප්‍රඥප්තියට හෙතුවූයේ ශුද්ධාෂ්ටකයයි කලාපවශ යෙන් ගණුත් හොත් ශුද්ධාෂ්ටකය හා සඳලහුතා මුදුතා කම්මඤ්ඤ තා යන සතරදෙනා හාසමග දොළොස්දෙන හෝයි; විමද්දිත්වා; * හස්වා; † අනුමොදථ, අනුමොවව්- නොපට පස් අනුසස් ලැබෙති යි තනි, ගම්භීරා, පුහුල්ම අතුරේනම් යි තනි; (238-) නසංඝෙසා කඨි නං අත්ථරති, සංඝතෙම කෙළින් නොඅතුරෙයි; සංඝස්ස, සංඝයා විසින්; උද්දිස්සතීති, උද්දිසතියත්නෙයි; පක්කමන්තන්තිකො, පක්ක මන්තන්තිකවූ; කඨිනුද්ධාරෙ, කෙළින් ඉදිරීම; ආදිච්චබන්ධුනා, සූර්ය වංශය බන්ධුනොට ඇත්තහු විසින්; ජිජ්ජති, සිඳෙද්ද; (239-) සහ බහිසීමගමනා, බහිසිමට යාම හා සඟ; නිට්ඨානන්තිකො, කොට නිටීම කෙළවර කොට ඇති; සන්නිට්ඨානන්තිකො, වෙහෙරටත් නොයම් සිවුරත් කෙරෙම් සනිටුහන් කෙරීම කෙළවර කොට ඇති, අපුබ්බං අචරිමං; පෙරපසු නොව දෙකම සිඳෙයි; නාසනන්තිකො, නැසීම කෙළව කොට ඇති. චීවරෙ නසෙ, සිවුර නැතිකල්හි; සවණන්තිකො, වෙහෙර කෙළින් ඉදිරීමහුගේ ඇසීම කෙළවර කොට ඇතියේ-ඇසූ සඳම අනුසස් නසී; ආසා වච්ඡෙදිකො, සිවුරැ ලැබෙසියන ආශාවගේ සිඳීමෙන් අනුසස් සිඳෙන කඨිනුද්ධාරය; උවජිත්නාය, සුන්කල්හි; සීමාතික්කන්තිකො, සිම ඉක්මීම කෙළවර කොට ඇති; (240-) සහුබ්භාරෙ, (පංචවා) අනුසස්මුල සිවුරගෙණ බිහිසිමට ගොස් සිවුරු නිමවූ කල්හි එම වෙහෙරින් ගිය මහණුන් එම වෙහෙර කෙළින් උදුළු බව කීවා ඇසූකල්හි සිවුරෙන් වෙගෙන් තම් නිමිකල්හි මේ ඇසු බැවින් උබ්භාරය ඇසූසඳ අනුසස් සිඳේ; සං කාධිනා, සංකාන්තතයෝද; එකුප්පාද, එක්ව ඉපදීම ඇත්තෝද; එක නිරොධා, එක්ව නිරොධය ඇත්තෝද; නානා නිරොධා; නාන් නාන් නිරොධය ඇත්තෝද; අන්තරුබ්භාර සහුබ්භාර දෙක අපචාරමූලක අනුසසින් එකකුත් නොනබා හැමම අනුසස් නසියි, සෙස්සවුන් ගේ අනුසස් න්‍යස් තුවුන්තනුගේ අනුසස් රකී.

## ක ඨි න භෙ දං .

---

ප ඤ්ඤ ත්ති ව ග්ගො.

---

* විමජ්ජිත්වා—පාලි † [illegible]

## 241-242-243-244 වෙනි පිටුවල:-

(241-) අනිස්සිතෙන, නොනිසන්නහු විසින්; නවප්පබ්බං, නො විසියයුතුද; (242-) අනභිරතිං, උකටලීය; වූපකාසෙතුං, තෙමේ සන්හිඳුවන්නටවත්; විනොදෙතුං, පහකරන්නට; විනෙතුං, හික්ම වන්නට; ආභිසමාචාරිකාය, ඛන්ධකවත්හි; ආදි බ්‍රහ්මචරියිකාය, පරි ජිසඟවෙසෙස්හි; පරිජිපවිනිළුව්; (243-) අලජ්ජීච හොති, සංචිච්ච ආ පත්තිං ආපජ්ජති යනාදිහි; අධිසීලෙ, පරිජි සඟවෙසෙස්හි; සීල විපන්නෙනා, නටසිල් ඇත්තේද; අජ්ඣාචාරෙ, චාරිත්‍රසිඛයෙහි; ආ චාර විපන්නො, නට ආචාර ඇත්තේද; අතිදිට්ඨියා, සම්‍යක්දෘෂ්ටියෙහි; දිට්ඨිවිපන්නො, නටදෘෂ්ටි ඇත්තේද; (අධිසීලෙ, චාරිත්‍රශීලයෙහිද) දවෙන, කෙළිසෙන්; සළපසාතිකෙන, විකුමෙන්- ව්‍යතික්‍රමයෙන්; කායිකෙන මිච්ඡාජීවෙන, කකුල්මෙහෙ ඈ කායිකවූ මිථ්‍යාජීවයෙන්) (244-) ආපන්නෙනා, ඇවැත් අවන්නේ; කම්මකතො, සඟහු විසින් කම්කරණලද්දේ;

අනිස්සිතවග්ගො පඨමො.

---

## 245-246-247-248-249-250 වෙනි පිටුවල:—

(245-) ඔමද්දකාරකොච, මැඩ කරන්නේත් වේද; රජොහරණ, පාපිස්නා; උපෙතබ්බො, එළඹියයුත්තී; මානානතොතා අස්සං, වෙත් නොවෙම්වයි කියා; බහුජන අරුචිකොච * බොහෝදෙනා විසින් නුරුස්නේත් වේද; උස්සිතමන්තී, මානුස්සානනකථා ඇත්තේවේද- මානයෙන් යුක්ත කථා ඇත්තේද- පච්චුකථා ඇත්තේද; නිස්සිත ජප්පී, අනුන් ඇසුරුකොට තමාගේ බලකියා තමා හුවා කියාද; නච භාසානුසන්ධිකුසලො, කථානුසන්ධියෙහිත් විනිශ්චයානු සන්ධියෙහිත් දක්ෂ නොවේද ? (246-) යථාධම්මො, † උභය විභංගයවූ ‡ පරිද් දෙත්; යථාවිනයො; චොදනා සාරණාවූ පරිද්දෙත්, චොදනා කරන්නේද; අකතෙනා, අප්‍රිය; උස්සාදෙතා හොනති, තමා පක්ෂය හුවාකියන්නේවේද; අපසාදෙතා, අනුන් පක්ෂය හෙළා කියන්නේ වේද; න බහුභාසති, බොහෝ නොකියාද; පග්ගහපවත්තා § හොති, මැඩ තමා කථා පවත්වාද; යථාදිට්ඨියා, ලබ්ධියවූ පරිද්දෙත්; (247-) විනයපරියත්තියා, විනය හැදෑරීමෙහි; කුකුකුච්චපකතානං, කුකුසින් මඩනා ලද්දවුන්ට; පටිසරණෙ, පිළිසරණ- වහල් වන්නේය; පච්චත්ථිකෙ, ප්‍රතිපක්ෂයන්; සහධම්මෙන, ප්‍රඥප්ති සිඛපදයෙන්;

---

* අරුචිතොච- † යථාධම්මෙ යථා විනයෙ-පාළි. ‡ විනය-ඇතම්.
§ පසය්හ-පාළි.

නොහොත් සකාරණයෙන්; සුනිග්ගහිතං, මනාකොට නිගත්නා ලදුකොට; නිග්ගණ්හාති, නිගත්තේය-නිග්‍රහකරත්තේය; සඞ්ඝම්ඨි-තියා, සඞ්ඝසමිතිය පිණිස- පවත්නා පිණිස;

## දුතියො වග්ගො

සමුට්ඨානං, කායොවාචාති ආදි; පයොග, කායිකාදී ප්‍රයොගය; වූපසමං, සමථ එවි; න විනිච්ඡයකුසලො හොති, මේ වස්තුව්‍යතික්‍රම යෙහි මෙ ඇවත් වන්නීයයි විනිශ්චය කරණසේ නොදනීද; (248-) සප්පටිකම්මං, සංඝාදිසෙසාදී ප්‍රතික්‍රියා සහිත; කම්මස්ස වත්ථුං න ජානාති, කර්‍මයට වත්නොදනීද; (249-) පදපච්චාභට්ඨං, පෙරව ගිය පදය පරවද පරව ගියපදය පෙරවද වරදවා—පෙරලි පදය; ඤත්තියා කරණං, නිස්සාරණාදිවූ ඥප්තියෙන් කිරීමය; (250) සුත්තං, උභයවිභඞ්ගය; සතර මහා අපදෙසය; විනයං, ඛන්ධකපරිවාර; විනයානුලොමං, මහාපදෙස්හු. න ච ඨානාඨානකුසලො, කිරීම් නොකිරීම්දෙක්හි දක්ෂ නොවේද; ධම්මං, සූත්‍රාභිධර්‍මය; ධම්මානුලොමං, මහාපදෙස්; විනයං, විනය පිටකය; ඛන්ධකපරිවාරමෙවවා, විනයානුලොමං, සතරමහාපදෙස්හු.

## වොහාරවග්ගො තතියො.

---

දිට්ඨාවිකම්මා, ඇවැත් දෙසීම්හු; අනාපත්තියා දිට්ඨිං ආවීකරොන්ති, නොඇවත ඇවැත්දෙසාද; චතූහි පංචහි; සතරපස් දෙනෙකු හා එක්ව-දෙදෙනා තුන්දෙනා එක්ව දෙසත්වට්; මනොමානසෙන දිට්ඨිං ආවීකරොන්ති, සිතීමෙන් ඇවැත් දෙසාද;

## 251-252-254-255-256-258 වෙනි පිටුවල :—

(251-) නානාසංවාසකස්ස සන්තිකෙ, ත්‍රිවිධ උක්ඛෙපනී කම් ලදුවන්හු කෙරෙහි; අපකතස්ස, උක්ඛෙපනීකම් ලද්දහු කෙරෙහි-එවි පොහොර් පවුරුණු තබන ලද්දහු කෙරෙහි එවි; කායෙන මෙරමා කයින්ද; දීයමානං, දෙනුලබන්නා; කායෙන, තමාකයින්; අප්පටිග්ගහීතං, නොපිළිගන්නාලද්දේය; අනතිරිත්තං, කැප නොකරණලද්දේ; අකප්පියං කතංහොති, කැප නොකරණ ලද්දේවේ- පස්වහන (පස්විකන;) කැපයෙන් කැප නොකරණලද වේද; අප්පටිග්ගහිතකතං හොති, පිළිගැන්ම නොකරණලද වේද; අනුච්චාරිත කතං හොති, එසවීම-ඔසවා පෑම නොකරණලද වේද-යොමු නොකරණලද වේද; අලමෙතං සබ්බන්ති අවුත්තං හොති, 'අලමෙතං

සබ්බං' සී නොකියනලදදේද; පවාරණා, වැළකීම; අසනං, * අඩාල භොජනය; භොජනං, පංචප්‍රකාර භොජනයන් අතුරෙන් එක් බොජුනක්; හත්ථපසෙස, † දෙරියන් වියත් අත්පසෙහි; අභිහරති, කයින් එළවාද; පටික්ඛෙපො පඤ්ඤායති, කයින් වචසින් වැළකීම පැනේද; (252) පටිඤ්ඤාතකරණා, ප්‍රතිඥයෙන් කිරීමද; අජ්ඣාපන්නා, අවත්නේ; ඔකාසකම්මං කාරාපෙතාස්ස, අවසරකරවන් නාහට; නාලං, නොහැකිද; චාවනාධිප්පායො, ශ්‍රමණභාවයෙන් චුත කරණු අදහස් ඇතිව, වත්තා, කියාද; (253) නාසාකවජ්ජාතබ්බො, සංසන්දනකථාව නොකටයුතු; මන්දත්තා, මන්ද බැවින්-නුවණ නැති බැවින්; මොමූහත්තා, මෝහයෙන් මුළා බැවින්; පාපිච්ඡාපකතො, ‡ ලාමක ඉච්ඡා ඇත්තේ-එයින් මඩනාලද්දේ; අසඤ්ඤබ්‍යාකරණා, අභිව්‍යාකරණයෝ; චිත්තක්කපා, සිත් පෙරලීමෙන්; අධිමානෙන, පසක් කෙළෙම් යන මනින්; භූතං, ඇති උතුරුමිනිස් ධම්; විසුද්ධියො, පිරිසිදුහු.

චතුත්ථො වග්ගො.

—×—

(**254**) අජ්ඣත්තං, තමා කෙරෙහි; පච්චවෙක්ඛිත්වා, බලා-එළවා; අච්ඡිද්දෙන, කඩනොවූ-සිදුරු නොවූ; අප්පතිමංසෙන, වෙෂයෙන් අනුන් විසින් නොගතහැකි-පරීක්ෂාකොට අනුන් විසින් සදෙසැයි නොගතහැකි-පිරිසිදුවූ-මේ ද්වේසසහිතයයි ගතහැකි කිසින් වරදක් නැති; "පරිසුද්ධෙන කායසමාචාරෙන සමන්නාගතො නුබො අම්හි" සංවිජ්ජති නුබො, ලැබේදෝ; වත්තාරො, කියන්නෝ; තංස, එබැවින්; වාචසිකං, වාචසික[illegible]වූ සීලය; මෙ චිත්තං සබ්‍රහමචාරීසු; මාගේ සිත සබ්‍රම්සරුන් කෙරෙහි; මෙත්තං නුබො පච්චුපට්ඨිතං, මෛත්‍රීන් යුක්තව එළඹ සිටියේදෝ; අනාඝාතී, විෂ්කම්භන වශයෙන් පහවූ ආඝාතය ඇත්තේදෝ; (**255**) ධතා, දරණලද්දාහුද; දිට්ඨියා, නුවණින්; සුප්පටිවිද්ධා, මොනොවට දන්නාලද්දාහුද; න සම්පාදෙති, නොසපයාද-කීයේ නෝහේද; කාරුඤ්ඤතා, කාරුණා ඇති බවද-හිත සො යන බවද; (**256**) නාලං, නුසුදුසුයි; අනුයොගං දාතුං, විචාළදෙය දෙන්නට-කියන්නට; අත්තාදානං, තමා තෙපුල් දීම-අධිකරණ ගැන්ම; පච්චවෙක්ඛිතබ්බං, නුවණින් බැලියයුතු; අත්තාදානං ආදාතුං, අධිකරණය ගන්නට; (**258**) අනුයුඤ්ජිතබ්බං, පිළිවිසියයුතුයි; පක්ඛෙ, පක්ෂවූවත්; අසංහීරො, අකම්ප්‍යද-පැකිළීම් නැත්තේද;.

අත්තාදානවග්ගො පංචමො

———

* ආසනං—† හත්ථපාසෙ.

## ධුතඞ්ගවග්ගං පුබ්බෙ වුත්තමෙව.

---

### 260-261-262-263-264-265-266 වෙනි පිටුවල:-

(**260**) පාරාජිකගාමී, පරිජිකවට යන; ඔමද්දිත්වා, මාගේ වචන යෙන් ඔහුගේ වචනය මැඩ; (**261**-) අදස්සනෙන, විනයධරයාගේ අලාභයෙන්-නොදක්මෙන්ද; අස්සවණෙන, කැප අකැප නොඇසීමෙන්ද; පසුත්තත්තා, * නිදන බැවින්; තථාසඤ්ඤිතා, † නිවරදදේ යන සංඥ ඇති බැවින්ද; සතිසම්මොසා, සිහි මුළාවෙන්ද; (**262**) වෙරා, වෛරීහු; වෙරමණියො, වැළකීම්හු; ව්‍යසනානි, පීඩාවෝ; සම්පදා, සමෘද්ධිහු;

### මුසාවාදවග්ගො සත්තමො.

---

පරිසක්කති, යත්න කෙරේද; භික්ඛු භික්ඛුනීහි හෙදෙති, මහණුන් මෙහෙණුන් හා බිඳවාද; (**263**) (භික්ඛු භික්ඛුනීහි) සම්පයොජෙති, මෛථුනයෙහි යොදද; ඔභාසති, අසභ්‍ය තෙපුල් කියාද; (**264**-) න ගහෙතබ්බා-න සාකච්ඡාතබ්බා, කප්පියාකප්පිය පිළිබඳ කථා නොකටයුත්තීයි; (**265**-) න අත්ථපටිසම්භිදාප්පත්තො හොති, අර්ථකථායෙහි ප්‍රභෙදගත ඥනයට නොපැමිණියේ වේද; යථා විමුත්තං චිත්තං, සතරඵල විමුක්තීන්ගේ වශයෙන් මිදුනු සිත-එකුන්විසි ප්‍රත්‍යවෙක්‍ෂාවන්ගේ වශයෙන්; න පච්චවෙක්ඛිතා හොති, නොපස්විකන්නේ වේද.

### භික්ඛුනොවාදවග්ගො පඨමො

---

උබ්බාහිකාය, තේරීම පිණිස; න අත්ථකුසලො, අර්ථකථායෙහි දක්‍ෂනොවේද; ධම්ම, පාලියෙහි; නිරුත්ති, භාෂාන්තර ජනතායෙහි-ව්‍යවහාරයෙහි; බ්‍යඤ්ජන, සිථිලධනිතාදී අකුරුලීමෙහි; පුබ්බාපර, පෙරපසුකථායෙහි; කුප්පති, වැසේද; (**266**) බ්‍යාපජ්ජති, පෙරළේද; පතිට්ඨියති, හැසේද-ස්තබ්ධවේද; කොපංජනෙති, ක්‍රොධ උපදවාද; අක්ඛමො හොති, ක්‍ෂමා නොවේද; අනුසාසනිං, අනුශාසනාව; අපදක්ඛිණග්ගාහී, දකුණින් නොගණිද-වැඩ ලෙහයින් නොගණිද; පසාරෙතා, චොදක චුදිත දෙදෙනාගේ කථාව මුළාකෙරේද; නොසාරෙතා, සිහිකොට නොදේද;

### උබ්බාහිකවග්ගො නවමො

---

* පසුත්තකතා- † තථාසඤ්ඤී—පාලිං

**270-271-272-275-වෙනි පිටුවල:—**

(**270-**) පුග්ගලගරු, පුගුලන් ගරුකොට ඇත්තේද; ආමිස, සිවුරු ආදී; **271** ආක රෙහි, කරණ ක්‍රමයෙන්; කම්මෙන, සතරකම්න් එක්කම්න්; වොහරන්තා, කියමින්; අනුසාවණෙන, ඇස්වීමෙන්; එතං පඨමුද්ධාතං, ඒ ආදිම පනවනලද; යථාරත්තං, රාත්‍රීගෙ පිළිවෙළින්; යථාපතිරූපං, සුදුස්සන්ගේ පිළිවෙළින්; එකං කම්මාකම්මං, එක්ව කරණ කුදු මහත් කර්‍මය; ආවෙනි, වෙනම;

අධිකරණවග්ගො දසමො.

---

(**272-**) ආපායිකො, අපායෙහි උත්පත්ති ඇත්තේද; නෙරයිකො, අවීචි මහ නරකයෙහි උත්පත්ති ඇත්තේද; අතෙකිච්ඡො, ‡ පිළියම් නැත්තේද; විනිධාය දිට්ඨිං කම්මෙන, ඒ අධර්‍මාදියෙහි මොහු අධර්‍මාදීහුය යන දෘෂ්ටිය ඇතිව ඒ දෘෂ්ටිය තරකොට පිහිටුවා හෙවත් ඔවුන් අධර්‍මාදි වශයෙන් ප්‍රකාශකොට වෙන්ව යම් කර්‍මයක් කෙරෙද්ද; ඒ වෙන්ව කරණ විනිධානය දෘෂ්ටිකර්‍මය හා සමග පංචාංගික වෙත්.

උද්දෙසෙන, පාමොක් උදෙසීම හා සමග පංචාංගික වෙත් මේ කර්‍මය උද්දෙස අංගත්වය ඒකාන්තයෙන් සංඝභෙද කෙරෙයි. වොහාරාදී තුන පූර්‍වභාගයෙ; වොහරන්තො, කියන්නේ-ඒ ඒ යුක්තින් කියා ගිවිස්වන්නේ; අනුසාසනෙන * අස්වැසීමෙන්; "කිං මය්හං අවීචිනිලුප්පලවනමිව සීතලා කිමහං අපායතො න භායාමි" යනාදීන් අස්වසාද; සලාකග්ගාහෙන, ලා ගැන්වීමෙන්; ඛන්තිං, කැමති වීම; රුචිං, අභිප්‍රාය; සඤ්ඤං, සංඥාව;

සංඝභෙදවග්ගො ඒකාදසමො.

---

(**275**) තයො තුන්දෙන; තෙපංචධා, පසළොස් පරිද්දකින්; (නයා) නෙයසා, දනයුත්තාහුයි; හෙඩිමෙ කණ්හපක්ඛම්හි, යට එකොළොස්වන කෘෂ්ණපක්ෂයෙහිවූ සංඝභෙදවග.

**275-276-277-278-279 වෙනි පිටුවල:-**

(275) සුක්කපක්ඛම්හි, ශුක්ලපක්ෂයෙහිවූ
මේ දෙළොස්වන වග.

—0—

---

* අනුසාවණෙන-පාළි. ‡ පාටිවෙජ්ජා ඉචජාපකතො-පාලි

## දුතිය සංඝභෙදකවග්ගො ද්වාදසමො.

---

යථාභතං නික්ඛිත්තො, ගෙණහැර සිටුවූ එකෙක් යම්සේද; එවං, එපරිද්දෙන්; නිරයෙ, නරකයෙහි වේද; (276) විනයබ්‍යාකරණා, විසඳීම්හු; පරිනාමෙන්ති, කියාද; න සමුච්ඡිජ්ජති, නොසිඳීද-එම නොපවතීද; පෙසකො, මෙහෙවර යොදන්නේ; පෙසිතාපෙසිතං ච, මෙහෙකළවුන්ද නොකළවුන්ද-මෙහෙයෙහි යෙදූවත් නොයෙදූවත්ද;

## ආවාසිකවග්ගො තෙරසමො.

---

(277) නිද්දං ඔක්කමයතො, නින්දට බස්නාහට; ඔතමසිකො, අඳුරෙහි හුන්නේ; අසමන්නාහරන්තො, වඳනා බව නොදන්නේ; සුත්තො, නිදන්නේ; එකාවත්තො, වෛරී පුහුල්; අඤ්ඤවිහිතො, අනිකක් සිතමින් වික්ෂිප්තවූයේ; ඛාදන්තො, පිටිකනදූ ආදියි; උක්ඛිත්තකො, උඛෙව්ත්වූහු තුන්දෙනා-මෙකීවවුන් අතුරෙන් නග්නයා උඛෙවූ නිකම් ලදුවත් වඳුත් ඇවැත්වෙයි සෙස්සවුන් වඳුත් නොසරුප් පමණි; (278) පුරෙ උපසම්පන්නන, යනාදී දෙවාරයෙහි දසදෙනා වඳුත් ඇවැත්වේ, උක්ඛිත්තකාය නග්නයාය පුරෙ උපසම්පන්නන යනාදී දසදෙනයයි මෙදොළොස් දෙන වඳුත් ඇවැත් වෙයි සෙස්සන් වඳුත් නොසරුපි; සදෙවකෙ, දෙවියන් සහිත; සමාරකෙ, මරුන්සහිත; සබ්‍රහ්මකෙ, බඹුන්සහිත; සස්සමණ බ්‍රාහ්මණියා, ශාසන ප්‍රතිපක්ෂ මහණ බමුණන් සහිත; සදෙව මනුස්සාය, දෙවිමිනිසුන් සහිතවූ; පජාය, ප්‍රජාව ඇති; ලොකෙ, ලෙව්හි; අරහං, නිෂ්පාපීවූ; සම්මා සම්බුද්ධො, තමන් විසින් මනාකොට සර්‍වධර්‍මයන් දත්; තථාගතො, සර්‍වඥතම; වන්දියො, වැන්දයුත්තේයි; අජ්ඣත්තං උපට්ඨාපෙත්වා, සියසතන එළවා, උභොහි පාණිතලෙහි; දෙඅත්ලෙන්; පාදෙ, දෙපත්ල; පරිසම්බාහන්තෙන, හඹන්නනු විසින්; පෙමංච ගාරවංච උපට්ඨාපෙත්වා, පෙමුදු ආදර දූ උපයා; පාදූ, පාදයෝ; වන්දිතබ්බා.

## කඨිනවග්ගො චුද්දසමො.

---

# උපාලිපංචකං නිට්ඨිතං.

—0×0—

(279) අචිත්තකො, සිත් නැතිව; ආපජ්ජති, යම් ඇවතකට අවද්දීද; අත්ථාපත්ති, ඒ ආපත්තිය ඇති-සහසෙය්‍යාදියයි; සචිත්තකො, සිත් ඇතිව; වුට්ඨාති, නැගේද-ඔහුගේම දෙසීමයි, සෙස්ස අට්ඨකථානුසාරයෙන් හැගේ, සමුට්ඨාන කථාත් මූල වෘත්තාන්තානුසාරයෙන් දතයුතු.

සමුට්ඨානං නිට්ඨිතං.

---

## 283-284-285-286-287-288-289 වෙනි පිටුවල:—

(283) කති ආපත්තියො කායිකා, කායිකාපත්තිහු කෙතෙක් දෙනද; කති වාචසිකා කතා, වාචසිකාපත්තීහු කෙතෙක්දෙන කරණලද්දාහුද; සංසග්ගපච්චයා, කය ගැටීම් පසයෙන්-මෙතැන් පටනුත් විනිශ්චය අටුවායෙන් හැගෙයි, පදාර්ථම දක්වමු; අරුණුග්ග, අරුණග-අරුණ නැගෙනසඳ; සබ්බසංගහො, සියලු සිඛාපදයන්ගේ සංග්‍රහය; (බුද්ධෙන) විනයස්ස, විනයට-විනයාගේ; යානි මූලානි පඤ්ඤත්තානි * ඔහු කෙතෙක් දෙනද; ඓ, ඔහු දෙදෙනයි; ගාමන්තරෙ, ගමතුරෙහි; නදීපාරපච්චයා, ගඟේ පරතෙරට යාම් පසයෙන්; නවමංසෙසු, මිනිස්මස් තබා ඇත්මස් ආදි සෙසු මසෙහි; වාචසිකාරත්තිං, රාත්‍රියෙහි වචසින් වන ආපත්තීහු; සප්පටිකම්මා, ප්‍රතික්‍රියා සහිතයෝ; කායවාචසිකානිච, කායිකවූද වාචසිකවූද; විනයගරුකා, විනයෙහි ගරුකාපත්තීහු; කතිවුත්තා, කෙතෙක් දෙන කියනලදහුද; (284) අත්තානං වධිත්වාන, තමා මරා පැහැර; ඤත්තියා කරණා, ඤත්තියගේ තිබුනු; වාචාපාරාජිකා, වචසින් ඇවැද්දයුතු පරිජි ඇවැත්හු; සංචරිත්තෙනත වා කති, සංචරිත්තය කරණකොටගෙණ කෙතෙක් වෙද්ද; වාති පදපූරණ; තයොකම්මානං සංගහා, "කඨිනදුස්සං ඉත්ථනාමස්ස දදෙය්‍ය සංඝො උපොසථං කරෙය්‍ය" යනාදීවූ ඤත්තිය තිබීමෙත්ද "ඉත්ථන්නාමස්ස දෙති කඨිනං අත්ථරිතුං අසම්භොගං කරොති" යනාදීවූ විප්පකතපච්චයෙන්ද "දින්නං සංඝෙන-කතං සංඝෙන" යනාදීවූ අතීත කරණයෙන් යයි ඤත්ති අනුසාවණ කම්මයන්ගේ සංග්‍රහයෝ තුන්දෙනෙකි; එකවාචිකා, එකවට කියවීමෙන්; ජඞ්ඝිතපච්චයා, විසඳීම් ආදි පසයෙන්; පාචිත්තියෙන දුක්කටා කතා, පාචිත්තිය හා සමග කෙතෙක් දුක්කටයෝ වෙද්ද; එත්ථ, ඒ භික්ඛුනො වාද කරණ කොටගෙණ ඇවැත්වේ; භික්ඛුනීනං ච, භික්ෂුණීන්ට; අක්ඛාතා, කියනලද; කතා,

---

* පඤ්ඤත්තා

උන්වම නියමකළ; පාටිදෙසනීයා-අළ, අටදෙනයි; ආමකධඤ්ඤා
න, වීත්; පාචිත්තියෙන, පාචිත්තිය හා සමග; තත්තිකා, එපමණම
වන්නාහ; සබ්බානි, සියල්ලෝම; නානාවත්ථුකානි, වෙන්වෙන්වූ
වස්තු ඇත්තාහ; අපුබ්බං අචරිමං, අවදනේත් පෙරපසු නොකොට;
එකතො, එකවටම; ආපජ්ජෙය්‍ය, අවදනේය; (285) පාචිත්තියා, ඒ
පාචිත්තියාපත්තීහු; කති, කෙතෙක් දෙන ද; සබ්බානි නානාවත්ථු
කානි, යානි පාචිත්තියානි අපුබ්බං අචරිමං එකතො ආපජ්ජෙය්‍ය
තානි පාචිත්තියානි කතිහොන්තීති සම්බන්ධො; නානාවත්ථුකානි,
නානාවස්තුකවූ යම් පචිති කෙනෙක් ඇද්ද; සබ්බානි පාචිත්ති
යානි, ඒ සියලු පාචිත්තියයන්; කතිවාචාය දෙසෙය්‍ය, කෙතෙක්
බසින් දෙසාද; ආදිච්චබන්ධුනා-කතිවුත්තා, ඔහුතුමු කෙතෙක් දෙන
යයි කියනලද හුද; පංච වුත්තා, පස්දෙනකැයි කියනලදහුද;
කිත්තනත්ථා, කියා; වොහාරපච්චයා, කීම් පසයෙන්; කතිඨානානි,
කෙතෙක් තැනද; අධිකංච, පස් සහ ධැම්යත්ට-අධිකරණයෙන්ම
සංහිඳීම වේ; කතිනනං වූපසමෙන, කෙතෙක් දෙනාට අධිකරණ
යෙන් සංහිඳුවනලද්දේ සංහුන්නානම් වේද; (286) නිජ්ඣානස්ස,
වන්නාහට; පිණ්ඩපාතපච්චයා, පිළිගැණිම් පසයෙන්; කතානිසංසෙ
සම්පස්සං, කෙතෙක් අනුසස් දක්නේ; පරෙසං සද්ධාය දෙසයෙ,
අනුන් කෙරෙහි හැදිහිල්ලෙන් දෙසාද; කතිනනං දෙසනාය, අප
රාධ දෙසීමෙන් සිද්ධ කීදෙනෙකුගේ වේද-නොහොත් අවවයදෙස
නාවෝ කීදෙනෙකුද; තිත්ථියවත්තනා, තිර්ථයන් පුරණවත්; අට්ඨවා
චිකා උපසම්පදානි, අට්ඨගරුධම්මපටිග්ගහණෙන උපසම්පදා; පච්චුට්ඨා
තබ්බං, දැක නැඟී සිටියයුතු; භික්ඛුනොවාදකො අට්ඨහි, අෂ්ටාඞ්ග
යෙන් යුත් මහණ භික්ඛුනොවාදක කොට සම්මත කටයුත්තේයි;
ඡෙජ්ජං, පරිජ්ඡේද; සබ්බෙසං එකවත්ථුකා, හැමදෙනාට සංඝභෙදක
වස්තුවෙන් එක වස්තුවෙක්; ඤත්තියා කරණා, ඤත්තියගේ කිරීම්හු;
අඤ්ජලිසාමීචිං ච නව, අංජලි කම් සාමීචිකමින් නොකටයුත්තේද-
අංජලිකම්සාමීචිකම් සමග; කතිපුග්ගලානාභිවාදෙතබ්බා, කෙතෙක්
පුහුලෝ නොවැන්දයුත්තෝද; (287) වස්සං වුත්ථානං, වැස නිමවූ
වස් ඇති; කතිනනං සති දාතබ්බං, කෙතෙක් දෙනාට ඇති කල්හි
දියයුතුද; කතිසතං ආපත්තියො, කෙතෙක් ආපත්ති ශතයන්;
රත්තියො ඡාදයිත්වාන, කෙතෙක් රාත්‍රීන් සඟවා; පාරිවාසිකො, පිරි
වෙස් පුරණ මහණ; කතිරත්තියො වසිත්වාන, කෙතෙක් රාත්‍රීන්
පිරිවෙස් වැස; මුඤ්චෙය්‍ය, මිදේද; දසසතං ආපත්තියො, දහසක්
ආපත්තීන්; රත්තිසතං ඡාදයිත්වා, සියක් රෑ සඟවා. මුඤ්චෙය්‍ය වා;
චම්පායං, චම්පා නුවර; විනයවත්ථුස්මිං, විනයවස්තුයෙහි; කතිකම්ම

දෙසා වුත්තා, කෙතෙක් කර්‍ම විපත්තීහු කියනලදහුද; සබ්බෙව අධම්මිකා කති, හැමම අධර්‍මිකවූයේවී කෙතෙක් දෙනද; අනන්ත ජිනෙන, නිවන් අරමුණුකොට ඇති බැවින් අප්‍රමාණ කෙලෙසුන් පැරදවූ; නොහොත් කෙළවර නොපෙණෙන නිවන් සම්ප්‍රයුක්තවූ-නොහොත් අපමණ දෙව් මිනිසුන් නිවන් දක්වූ; තාදිනා, ඉටු නිටු අරමුණෙහි එක්වැනිවූ; විවෙකදස්සිනා වික්ඛම්භන තදංගසමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණවිවෙකසංඛ්‍යාත විවෙකය දුටුවාවූ සර්‍වඥයා විසින්; යංදෙසිතා, ආපත්තික්ඛන්ධාදියයි සේයි; යානි ආපත්තික්ඛන්ධානි දෙසිතානි, යම් ඇවත් කඳු කෙතෙක් දෙසනලදහුද; එත්ථ, මෙහි; විනාසමථෙහි, සමථයන් හැර; කතිසම්මන්ති, කෙතෙක් දෙන සන්සිඳෙද්ද; විභංගකොවිද, විඥය; තං පුච්ඡාමි, තා විචාරමි; බ්‍රෑහි, කිය;විනාසමථෙහි, සමමනිසමථයෙන් නොසන්සිඳේ; විනයං පරිජානස්ස, විනය දන්වම් කියන බැවෙන; තෙ, තා කියන; විනයානි, විනයන්; සුණොම, අසමු; සමහර පොතක 'විසයානි සුණොමතෙ'යි කියාත් පාඨ ඇත. විසයානි, අරමුණු විෂයවූ ඔවුන්; (288) ඡ ඌන දියඩ්ඪසතා, එක්සිය සූසාළිස් සිඛයො; * ආවාසිකා සංඝභෙදකා, සංඝභෙදකායෝයයි; වුත්තා, වදාරණලදහ-මේ සියලු සූසාළිස් හෙදය සුළුවගසංඝභෙදකක්ඛන්ධකයෙහි විස්තර හෙයින් ආයේමැයි; (289) අඩ්ඪ සිනිසතං, එක්සිය අටාසූව;යාව සුපුච්ඡිතං තයා, යම් පමණව යහපත් කොටම තා විසින් විචාරණලද; යාවසුවිසජ්ජිතං මයා, එසේම මාවිසින් විසඳන ලද; පුච්ඡාය, පිළිවිස්මෙහිවත්; විසජ්ජනායවා, විසඳීමෙහිවත්; නත්ථි කිංචි අයුත්තකං, අයුක්තවූ නොයෙදෙන කිසිවකුත්නැති; පුච්ඡාවිසජ්ජනා දෙකම ඉතාමැනවි.

දුතිය ගාථා සංගණිකං.

---

## 290 වෙනි පිටේ:-

භික්ඛුනිච, මහණුන්හාද; භික්ඛුනිනිච, මෙහෙණුන්හාද; අසංවාසො, ජෝහෝ පවුරුණුආදී සංවාසයනැත්තේය; එකවෙච්චා සම්භොගො, නෑහැවිම් කැවීම් ආදිවූ පිළිදග්නා කෘත්‍යමිස-සමහර අනුදත් කෘත්‍යමිස සෙසු අකප්පිය සම්භොගය; තම්හි නලබ්භති, ඔහු කෙරෙහි නොලැබෙයි-දරුමා † මෙහෙණට සමහරෙක් අකපයි; අථවා එකවෙච්චා සම්භොගතාදි, තං නකප්පති; අවිප්පවාසෙන

---

* සුසාළිස්කන්ධයෝ-සමහර † දරුමූ-සමහරපොතක

අනාපත්ති, සහගාරසෙය්‍යාවෙන් මෙහෙණුන් දෙන්නටම අනාපත්තිය; පඤ්හාමෙසා කුසලෙහි විභාවිතා, මේ පැනය විඥයන් විසින් සිතනලදී- මේ පැනය දරුමා මෙහෙණ නිසා කියනලදී; මහෙසිනා, මහ ඉසිහු විසින්; පංච, ගුරුභාණ්ඩයෝ පස්දෙනෙක්; අවිස්සජ්ජිකා, * වියදම් නොකටයුත්තෝය; අවෙභඞ්ගියා † නොබෙදියයුත්තෝයයි; වුත්තා-විස්සජ්ජෙන්තස්ස, ඔවුන් වියදම් කරන්නාහටද: පරිභුඤ්ජන්තස්ස, ඉසුරුව අනුභවකරන්නාහටද; අනාපත්ති, ආපත්ති නොවේ-මේ ප්‍රශ්නය සාගෙහි විහාරය නසනකල්හි නොගුරු බඩුගෙණ වියදම්කොට ඉන් ලදදෙය ගෙණ වළඳන්නාහට අනාපත්ති බව; "සෙනාසන රක්ඛනත්ථාය විස්සජ්ජෙත්වා පරිභුඤ්ජිතුං වට්ටති" යි යතු ගෙණ කීහු; එහි කීයේමැයි, දසපුග්ගලෙ උක්ඛිත්තකාදි, දස අවන්දියපුගුලන්; නවඳමි, නොකියමි-ඔවුන්හැර; එකදසෙවිවජ්ජිය, පණ්ඩකාදි එකොළොස් දෙන හැර; බුඩ්ඪංවන්දන්තස්ස, බුඩ්ඪයා වඳනාහට-මේ නග්නයා නිසා කියනලදී; උක්ඛිත්තකො, න; උබෙව්නීකම් ලද්දේත් නොවෙයි; නවපන පාරිවාසිකො, පිරිවෙස් පුරන්නේත් නොවෙයි; නාසංඝභින්නො, සංඝභෙදය කළේත් නොවෙයි; නවපන පක්ඛසංකන්තො, තීර්ථකායතනයට ගියේත් නොවෙයි; සමාන සංවාසක භූමියංඨිතො, සමාන සංවාසක භූමියෙහිම සිටියේ; සික්ඛාය, ශික්ෂාවෙන්; කථංනු අසාධාරණො සියා, කෙසේ අසාධාරණවේද-මේ පැණය කරනැවැම් මහණු කරමසු පරිහරණය කළහොත් ඇවත්වෙයි කියා ඕහට ආවෙනිකකොට පනවනලදී. අත්තුපසංහිතං, වැඩිත්යුක්තවූ; කුසලධම්මං, කුශලධම්යන්; පරිපුච්ඡමානො, විසින්; උපෙති පරිසං, පෂීදව එළඹෙන්නේය-පරිසං යනු අධ්‍යාහාරයි; නජීවති, එතෙම ජීවත්වන්නේ නොවෙයි; නමතො, මෙළේත් නොවෙයි; න නිබ්බුතො, පිරිනිවියේත් නොවන්නේයි; බුඩ්ඪා තං පුග්ගලං කතමං වදනාති, බුදුහු ඒ පුගුලාකායයි වදළෝද-මේ පැනය නිර්මිත බුදුන් නිසා පනවනලදී; උබ්භක්ඛකෙන වදමි, අකුඇටින් මත්තෙහි මෛථුනයකුත් නොකියමි; අධොනාභි විවජ්ජිය, නාභියෙන් යටත් හැර-පෙකණියෙන් මත්තෙහි අකුඇටින් යට; මෙථුන ධම්මපච්චයා, මෙවුන්දම් සෙවීම් පසයෙන්; කථං පාරාජිකො සියා, කෙසේ පරිජි අවදනේද-මේ පැණය කවන්ධයා නිසා කියනලදී ඔවුන්ගේ කට ළමඳයි; "කංසීසං අඝොරහිතො අස්සාති කවන්ධො" හිකබු, මහණ; සඞ්ඝාටිකාය, වැ පොරෝ ඇ සයංයාචිත පරිෂ්කාරයෙන්; අදෙසිතවත්ථුකා, නොදෙසනලද කුටිවාසතු ඇති; පමාණාතික්කන්තං, පමණ ඉක්මුත්;

* අවිස්සජ්ජිකං † අවෙභංගිකං-පාළි

සාරම්භං, කිපිල්ලිකාසයාදි උපද්‍රව සහිත; අපරික්කමනං, උපචාර සහිත; කුටිං, කිළිය; කාරෙති-අනාපත්ති, ඕහට ඒ පසයෙන් ආපත්ති නොවේ-මේ පැනය තණසෙවනි කුටියනිසා පනවනලදී-උල්ලිත්තා වලිත්තාදි කුටියෙහි ඇවත්වෙයි, මෙහි නොවේ; දෙවන ප්‍රශ්නය දනිය තෙරුන් කළ සියලු මැටිමුවා කුටිය වැනි කුටිය නිසා කියන ලදී එහි ඇවැත්වේ; න කායිකං කිංචිපයොගමාචරෙ, කායිකවූ කිසි ප්‍රයොගයකුත් නොකරන්නේය; අපි, නැවත; නච වාචාය පරෙ භණෙය්‍ය, බසකින් අනුන් හාත් නොබණන්නේය-කථාවක්ම නොකරන්නේය; ඡෙජ්ජවත්ථුං, මුල් සිඳුවන වස්තුවට හෙවත් ගරුක පාරාජිකාවට; ආපජ්ජෙය්‍ය, අවදනේයි; මේ පැණය වජ්ජපටිච්ඡාදිකා මෙහෙණ නිසා කියනලදි; සතොනා, ඈතෙක්; කායිකං, කායිකවූද-කයින්ද; වාචසිකං, වචසින්ද; මානසා, මනසින්ද; කිංචි පාපංනකරෙය්‍ය, කිසි පවක් නොකෙරෙයි; සො, හෙතෙම; නාසිතො, නසන ලද්දේ; කිනති, කවර කාරණයෙන්; සුනාසිතො භවෙ, මොනොවට නසනලද්දේවේද-මේ පැනය පණ්ඩකාදි එකොළොස් අභව්‍ය පුද්ගලයන් නිසා කියනලදී-ඔහු මේ ජාතියෙහි පව් නොකෙරෙත් නමුත් අතීතජාතියෙහි කළ පවින් මේ ජාතියෙහි ලැබ්බයුතුම ප්‍රව්‍රජ්‍යාදිය නොවනලෙස වස්තු විපන්නවූ හෙයින් ගිහිව සිටියෝම මේව අභව්‍ය වෙත්; කෙනචිමනුජෙන, කිසි සතෙකු හාම; වාචා, වචසින්; අනාලපන්තො, ආලපනය නොකරන්නේ-නොකියන්නේය; ගිරං, තෙපල; නොවපරෙ භණෙය්‍ය, අනුන් හා නොබණන්නේමය-එසේ වූවත්-නොබිණුවත්; වාචසිකං, වාචසිකාපත්තියට; ආපජ්ජෙය්‍ය, අවදනේය; න කායිකං, කායිකවූ ආපත්තියට අවදනේ නොවෙයි-මේ පැනය පොහෝ අග පිරිසිදු විවාළකල්හි සාපත්තිකව නොබණත් නාහු අවදනා ආපත්තිය නිසා කියනලදී; බුද්ධවරෙන, සර්වඥවරයා විසින්; සික්ඛාපදා, ශික්ෂාපදයෝ; වණ්ණිතා, වර්ණනාකරණ ලදහ-පනවනලදහ-ඔවුන් අතුරෙන්; සංඝාදිසෙසා චතුරො, සංඝාදිසේසයෝ සතරදෙනෙක්; භවෙය්‍යුං, එකාවටම වෙති-හෙවත්; සබ්බෙ, ඔවුන් සතරදෙනාම; එකපයොගෙන ආපජ්ජෙය්‍ය, එක්පියෝයෙන් අවදනේය-මේ පැණය අරුණය යන මෙහෙණ නිසා කියනලදි; උභො, දෙන්න; එකතො උපසම්පන්නා, එකෙකීපක්ෂයෙන් උපසම්පදාව ලද්දෝය; උභින්නං හත්ථතො, දෙන්නා අතින්ම; චීවරං පතිගණ්හෙය්‍ය, සිවුරු පිළිගන්නේවීනම්; නානා ආපත්තියො සියා, පාචිත්තිය දුක්කටවශයෙන් වෙන්වෙන්වූ ආපත්ති වන්නාහ- මේ පැනය එකතො උපසම්පන්නාවූ මෙහෙණුන් දෙදෙනා නිසා කියන ලදී; චතුරොජනා, සතරදෙනෙක්; සංවිධාය, සමග බැණගෙණ; ගරුභණ්ඩං, පල්පොහොණ බඩුව; අවහරුං, සොරාගත්හ—ඔවුන්

අතුරෙන්; තයො-පාරාජිකා, පරිජි අවන්හ; එකො න පාරාජිකො, එකෙක් පරිජි නො අවන්නේය—මේ පැනය සාහසික ආණත්තික වශයෙන් කියනලදී එකි විනිස අටුවායෙහි කීයේමැයි.

**291 වෙනි පිටේ:—**

ඉතපිච-අබ්භන්තරෙ සියා, ඇතුළුගෙයි සිටියා වන්නීය; භික්ඛු ච බහිඩාසියා, මහණද ගෙන්පිටත සිටියෙක් වන්නේය; ජිද්දං තස්මිං ඝරෙ නත්ථි, වැළින් ඒ ගෙයි සිදුරක් නැත; මෙථුන ධම්මපච්චයා, මෙවුන්ධම් පසයෙන්; කථං පාරාජිකොසියා, කෙසේ පරිජි අවදනේ වේද-මේ පැනය සතරගෙය ඇතුළෙහි සිටි මානමක ඔහා එක් කොට මෙවුන් සෙවීමනිසා කියනලදී; තෙලං, තලතෙල් ඈ තෙල්ද; මධු, මීද; ඵානිතං චාපි, උක්පැනිද; සප්පි, එලගිතෙල්ද; සාමංගහෙ ත්වාන, තෙමේම ගෙණ; නික්ඛිපෙය්‍ය, තබන්නේය; අවීතිවත්තෙන සත්තාහෙ, සතිය ඇතුළත; සතිපච්චයෙ පරිභුඤ්ජන්තස්ස, ඇති කාරුණෙනි වළඳනාහට; ආපත්ති, ඇවත්වේ-මේ පැණය ලිඟු පෙර එනුවන් නිසා පවත්වනලදී-උන් භික්‍ෂුව සිටියවුන් ලිඟු පෙරළුන හොත්-මෙහෙණවූ කල්හි ආදි පිළිගෙණ තිබූවා පෙරලා පිළිගතයුතු පළමු පිළිනැඟුම් හැරෙණ හෙයින් මෙහෙණුන් ලිඟු පෙරළුන කලත් මෙම නයයි; නිස්සග්ගියෙන ආපත්ති, නිසගි පචිතියටද; සුඩකෙන පාචිත්තියං, සුඩපාචිත්තියටද; එකතො ආපජ්ජෙය්‍ය, එකවට අවදනේය—සඟහට පිරිනැමූ සිවුරු දෙකින් තමහට එකක් අනුන් හට එකක් විනවීම නිසා කියනාලදී; භික්ඛූ, භික්‍ෂූනු; වීසතියා සමාගතා සියා, වීංශතිවගී රැස්වූවෝත් වෙත්; සමග්ගසඤ්ඤිනො, සමග යම්හ යන සංඥ ඇතිව; කම්මං කරෙය්‍යුං, කම් කරන්නාහ; භික්ඛු, අන් මහණෙක්; වාදසයොජනෙ සිතොසියා, දෙළොස්යොද නෙක සිටියේ වන්නේය; වග්ගපච්චයා, වගී පසයෙන්; තං කම්මං ච කුපෙය්‍ය, ඒ කම්මය කොප්‍යවන්නේය—මේ පැනය දෙළොස් යොදුන් ආදි ගාමසීමා නිසා කියනලදී; පදවීතිහාරමත්තෙන, පිය වර ඉක්මවූ පමණින්ද; වාචාය භණිතෙන, බසින් දෙඩූ පමණින්ද; සප්පටිකම්මානි, ප්‍රතික්‍රියා සහිතවූ; ගරුකානි, ගරුකවූ; සබ්බානි; සියලුම; චතුස්සි ආපත්තියො, සූසැට ආපත්තීත්ට; එකතො ආපජ්ජෙය්‍ය, එකවටම අවදනේය-මේ පැනය සංචරිත්තය නිසා කියන ලදී; නිවත්ථො අන්තරවාසකෙන, හඳනා සිවුරෙන් වසන ලද්දේ, හෙවත් හඳනාලද්දේම; දිගුණං සංඝාටිපාරුතො, සහළ පොරොණා දෙක එක්කොට පොරෝනා ලද්දේය—ඒ තුනම කයින් තොරවූයේ නැවත; සබ්බානි තානි නිස්සග්ගියානි හොන්ති, ඒ සියලු චීවරයෝ නිසදියයුතුවෙත්—මේ පැනය මෙහෙණුන් ලවා දෙසූ සිවුරු නිසා කියනලදී; න චාපි ඤත්තිං, ඤත්තියත් නැත; නවපන කම්මවාචා'

කම්මවාක්‍යය කියවූයේත් නැත; නමෙහි භික්ඛුනී ජිනෙ අවොච, එහි භික්ෂුණිය සර්වඥත් නොවදාළේය; සරණගමනම්පි නාව තස්ස අත්ථි, සරණාගමනොපසම්පදාවත් ඕහට නැත; උපසම්පන්නො, වැළිත් උපසම්පන්නවිය; උපසම්පදා චස්ස අකුප්පා, ඔහුගේ මහලු පැවිද්දත් අකොප්‍යය; මේ පැනය මහා ප්‍රජාපතීගේ උපසම්පදාව නිසා පනවන ලදී; අෂ්ටගරු ධර්මයන්ගේ පිළිගැන්මෙන්ම ඕ මහලු පැවිදිවූ; ඉත්ථිං හනෙ, ස්ත්‍රිය මරන්නේය; න මාතරං, වැළිත් මව නොවෙයි; පුරිසං ච හනෙ, පුරුෂයාත් මරන්නේය; න පිතරං, වැළිත් පියා නොවෙයි; හනෙය්‍ය අනරියං, ස්ත්‍රියවත් පුරුෂයාවත් ආර්‍ය්‍ය නොවූව මරන් නේය; මෙතෙ, ඒ නුවණ නැත්තේ; තෙනච, ඒ මැරීම් පසයෙන්ද; අනන්තරං ඵුසෙය්‍ය, ආනන්තරියක් ස්පර්ශකරන්නේය-ආනන්තරිය සිඬකරන්නේය-මේ පැනය ලිඟු පෙරළුනුවවුන් විසින් මරන්නවුන් නිසා කියනලදී; මාතරං පිතරං හන්ත්වා, මව්පියන් දෙදෙනා මරා; තෙන, ඒ කර්මය හෙතුකොටගෙණ; අනන්තරං න ඵුසෙය්‍ය, ආන න්තරිය ස්පර්ශය නොකරන්නේය; මේ පැනය මිනිස්වසිට තිරිසන්වූ දෙමව්පියන් මරන්නවුන් නිසා කියනලදී; අචොදයිත්වා, චොදනා නොකොට; අසාරයිත්වා, සිහිනොකරවා; අසම්මුඛීභූතස්ස, හමුනො වූවාහට; කරෙය්‍ය කම්මං, කර්ම කරන්නේය; කතංච කම්මං සු කතං භවෙය්‍ය, කරණලද කර්මය මනාකොට කරණලද වන්නේය; කාරකො ච සංඝො අනාපත්තිකොසියා, මේ කර්මය කළ සංඝද අනා පත්තික වන්නේය; මේ පැනය දූතයා ලවා මහලු පැවිදිකිරීම නිසා කියනලදී දෙවෙනි පැනය පණ්ඩකාදීන්ගේ මහලු පැවිදි කිරීම නිසා කියනලදී.

**292 වෙනි පිටේ:—**

ඡින්දන්තස්ස, ගස් ආදිය කපන්නාහට; ඡින්දන්තස්ස, කෙස් ආදිය සිඳුනාහට; ඡාදෙන්තස්ස, ඇවැත් ආදිය සඟවන්නාහට; ඡාදෙ න්තස්ස, ගේ ආදිය සොයන්නාහට; සච්චං භණන්තො, සැබවස කියන්නේ; ගරුකං, සඟවෙසෙස් වෙයි-අවද්දී; මුසාභාසතො, බොරු කියන්නාහට; ලහු, පචිතිවෙයි; මුසාභණන්තො ගරුකං, බොරුකියන්නේ පරිජි අවද්දි; සච්චං භාසතො ලහු, සැබවස කියන් නාහට ලහුකාපත්තිවූ ථුලසිනෙව්; අධිට්ඨිතං ච, ඉටනලද්දාවූද; රජ නාය රත්තං, කැපරදනින් රඳනා ලද්දාවූ; කප්පකතම්පිසන්තං, කප් බිඳුදුන්නාවූද සිවුර; පරිභුඤ්ජන්තස්ස, වළඳ කරන්නාහට; ආපත්ති ඇවත්වෙයි-මේ පැනය ආදිය ඉටා වළඳ කෙරෙමින් සිටියදී නිසඟිවූ සිවුර නොනිසඳ වළඳ කරන්නහු නිසා කියනලදී; අත්ථංගතෙ සුරියෙ, හිරු අස්තයට ගියකල්හි; භික්ඛු මංසානි ඛාදති, මහණෙක් මස්කන්නේය; න උම්මත්තකො, උමතුත් නොවෙයි; නවපන

බින්නචිත්තො, පෙරළි සිතැත්තේත් නොවෙයි; නචාපි සො වෙද නට්ටො භවෙය්‍ය, නැවත ඒ වේදනාවකින් ඇත්තවූයේත් (පෙළුණේත්) නොවෙයි; නචස්ස හොති ආපත්ති, ඕහට ඇවත්වන්නීත් නොවෙයි; සොචධම්මො සුගතෙන දෙසිතො, ඒ ධර්මයද තථාගතයා විසින් දෙසනලද මේ පැනය ලොමුකොටන මහණහු නිසා කියන ලදී; නරත්තචිත්තො, මෛථුන රාගයෙන් රත්වූ සිත් ඇත්තේත් නොවෙයි; නච පන ථෙය්‍යචිත්තො, සොරසිත් ඇත්තේත් නොවෙයි; නචාපි සො පරම්මරණාය චෙතයි, නැවත ඒ මෙරමා මරණු පිණිස යත්නත් නොකෙළේය; දෙන්නස්ස හොති ඡෙජ්ජං, දෙන්නා හට පරිජිවෙයි; පටිග්ගණ්හන්තස්ස ථුල්ලච්චයං, මේ පැනය සංඝභෙදය පිණිස ලා දෙන්නහු නිසා කියනලදී; සාසංකසම්මතං, ආශංකා සහිතයයි ප්‍රසිද්ධය; නචාපි ආරඤ්ඤකං, වල්සෙනසුනකුත් නොවෙයි; නපි සංඝෙන සම්මුති දින්නා, භික්ෂුසංඝයා විසින් අවිප්පවාස සම්මුතිත් දෙනලද නොවෙයි; නචස්ස කඨිනං අත්ථතං, ඕහට කෙළින් අතුරණ ලද්දේත් නොවෙයි; තත්ථෙව, එතැනම; චීවරං නික්ඛිපිත්වා, සිවුර තබා; ගච්ඡෙය්‍ය අඩ්ඪයොජනං, දෙගව්වකුත් යන්නේය; තත්ථෙව අරුණං උග්ගච්ඡන්තස්ස, ඒ ගිය තැනම අරුණ නගන්නා හට; අනාපත්ති, ආපත්ති නොවෙයි; මේ පැනය මහත් ගසසෙවණ අවිරළතැන සිවුර තබාලා එහිම අවිරළ තැනක සිට අරුණ නංවන්නාහට ආපත්ති නොවන නියාව නිසා කියනලදී; කායිකානි, කයින් වෙයි; න වාචසිකානි, වචසින් නොවෙයි; සබ්බානි, සියල්ලෝම; නානාවත්ථුකානි, වෙන්වෙන්වූ වස්තු ඇත්තෝය-ඒ ඇවතම අවදනේද; අපුබ්බං අචරිමං, පෙරපසුනොකොට; එකතො ආපජ්ජෙය්‍ය, එකවටම අවදනේය-මේ පැනය බොහෝ මානමුත්ගේ කෙස් හෝ ඇඟිලි හෝ එක්කොටගෙණ සහවෙසෙසුන් අවදනහු නිසා කියන ලදී; දෙවතාගාථාව, "සබ්බා තුමෙහ සිඛරණීයො" යනාදීන් තුළුල් තෙපුල් බැණ සහවෙසෙස් අවදනහු නිසා කියනලදී; තිස්සිත්ථියො, මිනිස් නොමිනිස් තිරිසන් යම් ස්ත්‍රීනු තුන්දෙනෙක් කියනලදහුද ඔවුන් හා යම් මෙවුන් සෙවීමෙක් ඇද්ද; තං මෙථුනං නසෙවෙ, ඒ මෛථුන සේවනයත් නොකෙරෙයි; තයොපුරිසෙ, එසේම පුරුෂයන් තුන්දෙනා කරා ගොසිනුත් මෛථුන සේවනය නොකෙරෙයි; තයොච අනරියෙ පණ්ඩකෙ, උභතොබ්‍යඤ්ජක සංඛ්‍යාත අනාර්‍ය්‍යයන් තුන්දෙනා හාද පණ්ඩකයන් තුන්දෙනා හාද මෙවුන් සෙවුනේත් නොවෙයි; නචාචරෙ මෙථුනං බ්‍යඤ්ජනස්මිං, ලම්බිපරිජි ආදිවූ අනුලොම් පරිජි වශයෙන් මෙවුන් * සෙවුනේත් නොවෙයි; ඡෙජ්ජං

* ඔමුවෙන්-සමහර-

සියා මෙථුනධම්මපච්චයා, මෛථුන්ධම් පසයෙන්ම පරිජීවන්නේය; මේ පැනය අෂ්ටවස්තුක පාරාජිකාව නිසා කියනලදී; මාතරං පිතරං † යාචෙ, මව අතින් පියා අතින් ඉල්වන්නේය; නොච සංඝෙ ‡ පරිනතං, සඟහට පිරිනැමුවා ඉල්වන්නේත් නොවෙයි; අනාපත්ති ච යාචනකෙ, වැළින් නැයන් විනවීමෙහි අනාපත්ති කියන ලද; කෙනස්ස හොති ආපත්ති, කවරකාරණයකින් ඕහට ආපත්ති වේද; මේ පැනය නොසමයෙහි වැසි සළු සිවුර සතුප්පාද කරවන නිසා කියනලදී; කුද්ධො, කිපියේ; ආරාධකො හොති, සිත්ගන්නේ වෙයි; කුද්ධො, කිපියේ; ගරහියො, ගහා කටයුත්තේය; අථ, නැවත; යෙන, යම් කාරණයකින්; කුද්ධො, කිපියේ; පසංසියො, පැසසියයුතු වේද; සොකො නාමධම්මො, ඒ කවරනම් ධර්මයෙක්ද—මේ පැනය තිර්ථයන් නිසා කියනලදී ඒ වත් පුරමින් සිට තීර්ථකයන්ගේ ගුණ කී කල්හි කිපෙන්නේ සිත්ගණී; තුනුරුවන් ගුණ කියනකල කිපෙන්නේ ගැරහියයුතුවේ. දෙවන ගාථාවත් මෙ නිසා කියනලද උක්ත විපර්යාශයෙන් අර්ථ යෙදියයුතු.

**293-294-වෙනි පිටුවල:—**

(**293**) සංඝාදිසෙසං–යනාදි ගාථාව කායසඟරුයෙන් තෙත්වූ මෙහෙණ එසේම තෙත්වූ පුරුෂයා අතින් අහර ගෙණ මිනිස්මස් ලුණු පිණි බොජුන් සෙසු අකප මස් හා එක්කොට අනා වළඳන්නී අවද්දී ඈ නිසා කියනලදී. “උභොපරිපුණ්ණවීසතිවස්සා” යනාදිය ගසසිටද බිම සිටද කම් වාක්‍ය කියවන හෙරණුන් නිසා කියනලදී, එයින් ආකාශස්ථයා අනුපසම්පන්නයි; අකප්පකතං, යම් සිවුරෙක් කප්බිඳු නොදනලදද; නපි රජනායරත්තං, නොමරඳනින් රඳන ලදද; තෙන නිවත්ථො, ඒ සිවුරෙන් අඳනාලද්දේ-හැන්දේ; යෙන කාමං වජෙය්‍ය, කැමති යම් තැනකට යන්නේය; තවස්ස හොති ආපත්ති, ඕහට ආපත්ති නොවෙයි—මේ පැනය අසුන් සිවුරුඇති මහණුන් නිසා කියනලදී; නදෙති, මෙහෙයන තැනැත්තී නොදෙයි; න පටිගණ්හාති, මෙහෙයනලද තැනැත්තී මෙහෙයන මෙහෙණ අතින් නොපිළිගන්නීය; තෙන, ඒ කාරණයෙන්; පටිග්ගහො නවිජ්ජති, මෙහෙයන තැනැත්තිය අතින් මෙහෙයනලද මෙහෙණගේ පිළිගැන්ම නැත; ආපත්තිගරුකං, එසේවුවත් කායසඟරුයෙන් තෙත්වූවහු අතින් පිඩු පිළිගැන්මෙන් මෙහෙයන මෙහෙණ සඟ වෙශෙසට අවදිනීය; න ලහුකං, ලහුකාපත්තියට අවදනේ නොවෙයි; තච පරිභොගපච්චයා, ඒ ආපත්තියට අවදනාත් මෙහෙයන මෙහෙණගේ වැළඳීම් පසයෙන් අවද්දී මෙහෙයන මෙහෙණගේ අව

† මාතරං චීවරං-පාලි- ‡ තොමෙ සංඝස්ස-පාලි

සත්ති සඞ්ඝාවසෙසට අවදී දෙවනගාථාව ඇගේම දිය දූහැටි ගැන් මෙහි මෙහෙයීම නිසා කියනලදී; ආපජ්ජන්ති ගරුකං සාවසෙසං, සාවසේසවූ ගරුකාපත්තියට අවද්දී; න ඡාදෙත් අනාදරියං පටිච්ච, අනාදරයෙහි පිණිස සඟපත්නේත්නොවේයි; න භික්ඛුනී, මෙහෙණින් නොවෙයි; නො ච ඵුසෙය්‍ය වජ්ජං ඡාදනප්‍රත්‍යයෙන් අත් ඇවත කටත් නො අවද්දී; පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා, මේ පැනය; විනයඥයන් විසින් සිතනලදී මේ පැනය උබෙව්තිකම් ලද්දහුනිසා කියනලදී.

---

## සෙදමොචක ගාථායි.

---

### අඨී සොළසා ධාසොල්වන ගාථායි,

(294) විපජ්ජනති. නසිද්ද; වත්ථුවිපන්නං, නවවසතු ඇත්තේය; පටිපුච්ඡා, පිළිවිස; න පරාමසති. නොගණිද-නොකියාද; අතිඛුද්දක සීමං, ඉතා කුඩාසීම; සම්මනනති, සම්මා කෙරේද; ජාතස්සරෙ, එම විල; සමභිනදති, මුසුකෙරේද; අජ්ඣොත්ථරති, මඩීද; පකතනතා, පුවනක්වූ; සම්මපපතතා, කම් ප්‍රාප්තයෝය; අපිච, වැළි කුළට නිසිද;ඔසාරණං, ඇතුළත් කිරීමටය; පංචමං, පස්වනුවූ; කම්ම ලක්ඛණසඞ්ඛාව, කම්ලක්ෂණයටද යන සෙසු ඔසාරණනිස්සාරණා දීහු කම්ත් වෙති; අත්නමුත් ලැබෙති, මේ කම් ලක්ෂණයවූකලී කිරීම් ලක්ෂණයමුත් ඔසාරණාදි අනිකක් නොකොටහෙන හෙයින් කම්මලක්ෂණ නම්වී;

කම්මවග්ගං පඨමං.

---

### 298-299-300-302-වෙනි පිටුවල:—

(295) වෙ අත්ථවසෙ පටිච්ච, අර්ථකොට්ඨාස දෙකක් පිණිස; පකඛුපවෙඡ්දය, පක්ෂ නැසීම පිණිසය යන;

අත්ථවසවග්ගං දුතියං.

---

(299) ඔසාරණීයං, ඇතුළත්කටයුතුබව.

පඤ්ඤත්තිවග්ගං තතියං.

---

අපපඤ්ඤතෙතා, නොපනවනලද්දෙහි; පඤ්ඤතෙතා, පනවන ලද සිඛපදයෙහි; අනුපපඤ්ඤතතං, අනුප්‍රඥප්තිය පනවනලද;

අප්පඤ්ඤත්තිවග්ගො චතුත්ථො.

---

(300) අධිකරණෙ සමුප්පන්නෙ, අධිකරණ උපන්කල්හි; උභො අත්ථපච්චත්ථිකා, ප්‍රතිපක්ෂවූ අර්ථ ඇති දෙන්නම; සවෙආහංසු, ඉදින් කිව්නම්; පටිච්ඡිතබ්බං, පිළිගතයුතුයි;

නවසංගහවග්ගං නිට්ඨිතං.

---

තස්ස ථුතිං වක්ඛාමි, ඒ පරිවාරයට ස්තෝත්‍රය කියමි; (302) පුබ්බාචරියමග්ගඤ්ඤු * පූර්වාචාර්‍ය්‍ය ක්‍රම දන්නාවූ-ආචාර්‍ය්‍ය පරම්පරාව දන්නාවූ; සුතධරො, ශ්‍රැතය ධරන්නාවූ-බහුශ්‍රැතවූ හෙවත් තෙවලාධරවූ; විචක්ඛණො, විචක්ෂණවූ-බුද්ධිමත්; එහෙයින්ම; මහාපඤ්ඤො, මහ නුවණ ඇති; දීපනාමො, දීපනම් මහතෙරනු; තහිං තහිං, ඒ ඒ තැන; පුච්ඡිත්වා, පුච්ඡාවකොට; න විත්ථාරං, අති විස්තාරයද; නසංඛෙපං, අති සංක්ෂෙපයද හැර; සික්ඛකානං, † උගන්නවුන්ට; සුඛාවහං, සුවඑලවන්නාවූ; මජ්ඣිමෙ, සජ්ඣායමග්ගෙන, මධ්‍යමවූ සජ්ඣායමාර්ගයෙන්-හදාරණ ක්‍රමයෙන්; චින්තයිත්වා, සිතා; ලෙඛාපෙසි, එාසුලෙස ලියවී; පරිවාරනති යංවුත්තං, පරිවාරයයි යමක් කියනලදද ඔහුගේ පදසිද්ධිය නාවර-කොලෙස පරිවාරනම්වීද; සද්ධම්මෙ, සියලු පාලිධර්මයෙහි; අත්ථං අත්ථෙන, අර්ථය අර්ථය හාද; ධම්මං, පාලි ධර්මය; ධම්මෙන, පාලිධර්මය හාද; ඤායතො, නය හෙයින්; ජම්බුදීපසාගරො ඉව, දඹදිව පිරිවැරූ මහ මුහුදමෙන්; සාසනං, මේ සියලු ප්‍රතිපත්ති ශාසනය; පරිවාරෙසි,, යම් හෙයකින් පිරිවැරූද; හෙවත් සියලු විනය පිටකය සංග්‍රහකොට සිටියේද-එහෙයින් පරිවාරනම් විය; පරිවාරං තජ්ජානන්තො, පරිවාරය නො දන්නේ; කුතො ධම්මවිනිච්ඡයො, කොයින් කෙසේ ධර්මවිනිශ්චය කරන්නේද; විපත්ති, විපත්තිහෙයින්ද; පඤ්ඤත්ති, ප්‍රඥප්ති හෙයින්ද; අනුප්පඤ්ඤත්ති, අනු ප්‍රඥප්තිහෙයින්ද; පුග්ගලො, පුද්ගල හෙයින්ද; එකතොචෙව, එකතො ප්‍රඥප්තිහෙයින්ද; උභතොචෙව, උභය ප්‍රඥප්ති හෙයින්ද; ලොකවජ්ජතො, ලොකවජ්ජ හෙයින්ද; පණ්ණත්තිවජ්ජතො, ප්‍රඥප්තිවද්‍යහෙයින්ද; යස්ස, යමෙකුට; විමති, ජායති, විමති උපදීද-ඒ සියලු විමතිය; පරිවාරෙනඡිජ්ජති, පරිවාරයෙන් සින්දේ; මහාසෙනො, මහාසේනාව මැද; චක්කවත්තීව, සක්විත්තා මෙන්ද; මිගමජ්ඣෙ, චතුෂ්පද මධ්‍යයෙහි; කෙසරී, කෙසර සිංහරාජයා මෙන්ද; රංසිපරික්ඛිණ්ණො, රසින් පිරිවරණලද රවි, හිරුමෙන්ද; තාරාගණො, තරු සමූහයා විසින් පිරිවරණලද; චන්දෙයථා, චන්ද්‍රයාමෙන්ද; බ්‍රහ්මපරිසෙ, බඹ පිරිස්මැද සිටි, බ්‍රහ්මාව, හාරිතනම් මහා බ්‍රහ්මයා මෙන්ද; ගණමජ්ඣෙ, ශ්‍රාවක ගණයා මධ්‍යයෙහි; නායකො ඉව,බබලන ලොකස්වාමීහුමෙන්; එවං, එසේම; සද්ධම්මනිතයො, විනය සංඛ්‍යාත පාලිධර්මය; පරිවාරෙන සොභති, පරිවාරයෙන් සොබින්නේයි-පරිවාරය හෙතුකොටගෙණ හොබී.

**පරිවාරගන්ථිපදය නිමි.**

---

* පුබ්බාචරියමග්ගඤ්ච † සිස්සානං—පාලි.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 15 | 3 | විසුඞියො | විසුද්ධියො |
| 15 | 5 | 186 | 186; 187, |
| 16 | 18 | නවමං | නවකං |
| 16 | 23 | කීයෙන් | කීතියෙන් |
| 16 | 24 | ධර්මියන් | ධම්මියන් |
| 17 | 8 | පවාරණතො | පකාරණතො |
| 18 | 26 | පාරාජිකාය | පාරාජිකා අටය |
| 18 | 26 | සඟවෙසෙස්ය | සඟවෙශේස්තෙලෙසය |
| 18 | 27 | සඟවෙසෙස්යයි | සඟවෙසෙස් දසයයි |
| 18 | 31 | ඇතිව | ඇතිව |
| 19 | 18 | අංගුල | අට්ඨංගුල |
| 19 | 18 | අංගුල | අට්ඨංගුල |
| 19 | 24 | පාරාජිකාති | පාරාජිකානි |
| 19 | 27 | මෙහෙණුන්ගේ | මහණුන්ගේ |
| 20 | 1 | අන්ධකාරවගය | අන්ධකාරවගය නග්න වගය |
| 20 | 13 | ජොතිවගය | ජොතිවගය දිඝිවගය |
| 20 | 26 | යථාකථං | යථාතථං |
| 21 | 12 | පලනොදක්ඛන | පලමුනොදන්වන |
| 21 | 23 | විවදන | විදන |
| 26 | 2 | පදසම්බන්ධමෙව් | පදසම්බන්ධවේ |
| 26 | 24 | සිහිතරවා | සිහිකරවා |
| 27 | 13 | නිබ්බිදතු | නිබ්බිදනු |
| 32 | 6 | අ.ලජ්ජිව | අලජ්ජිව |
| 32 | 18 | පාපිස්හා | පාපිස්නී |
| 32 | 18 | දස්සං | අස්ස නති |
| 34 | 27 | නෝහේද | නොහේද |
| 35 | 3 | මාගේ | තමාගේ |
| 36 | 3 | ආකරෙති | ආකාරෙති |
| 42 | 2 | සහිත | රහිත |
| 42 | 12 | මානසා | මනසා |
| 43 | 9 | සතරගෙය | විසතුගෙය |
| 43 | 17 | හෙයින් | හෙයිනි |
| 46 | 35 | මෙහෙණගේ | මෙහෙණගේ වැළඳීම් |
| 47 | 2 | ආපජ්ජන්තී | ආපජ්ජති |
| 47 | 5 | අන් | අවන් |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු